## 2019/05/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/05/14 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.05.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 මැයි මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.04.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.04.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. දකුණු පළාත පුරා ක්‍රියාත්මක කඩිනම් ඩෙංගු මර්ධන වැඩසටහන -2019 පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2019.05.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභා ගත කරන ලදී

02. දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2019 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන වෙනත් සේවා මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද 2019.04.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2019 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රජා ජල සම්පාදනය නාන තොටුපල සංවර්ධනය කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද 2019.04.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. ගම් පෙරළිය වැඩසටහන - 2019 මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2019.04.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද 2019.04.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. ප්‍රජා ශාලා හා බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අමුද්‍රව්‍ය ලබා දීම - මන්ත්‍රී ප්‍රතිපාදන 2017 යටතේ ලැබී ඇති දකුණු පළාත් ගරු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාගේ මුදල් ප්‍රතිපාදන වලින් කෙත්සිරි බෝධිරාජාරාම විහාරස්ථානයේ චෛත්‍යය ඉදි කිරීමේ කටයුතු සඳහා සිමෙන්ති මලු 10 ක් ලබා දෙන ලෙස ඉල්ලා සම්පත් අතුකෝරල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

07. සභා රැස්වීම් වාර්තාව පරික්ෂා කිරීම -ජනවාරි මාසය නාගොඩ ප්‍රාදේශීය සභාව යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල මගින් යොමු කරන ලද 2019.04.29 දිනැති විමර්ශන වාර්තාව සභා ගත කරන ලදී.

08. දසමස් වැටුප් අත්තිකාරම් මුදල ලබා දෙන ලෙස ඉල්ලා එච්.ඩබ්. සන්ධ්‍යා මල්කාන්ති මහත්මිය විසින් යොමු කරන ලද 2019.04.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. ක්ෂේත්‍ර නිලධාරී දීමනාව අනුමත කර දෙන ලෙස ඉල්ලා සංවර්ධන නිලධාරී, කේ.ජී.මානෙල් සුදර්ශනී මහත්මිය විසින් යොමු කරන ලද 2019.05.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

10. 252-6478 දරන කැබ් රථයේ රක්ෂණ ආවරණය අලුත් කර ගැනීම සම්බන්ධව, රියදුරු බී.ජී. පියතිලක මහතා විසින් යොමු කරන ලද 2019.05.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. සමාන්තර දුරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීම සම්බන්ධව ගා/නාප්‍රාස/ආ/04 විෂය මගින් යොමු කරන ලද 2019.05.13 දිනැති ලිපිය සභාග කරන ලදී.

12. ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධව ටී.ජී. සුමනසිරි මහතා විසින් 2019.05.13 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

13. වීපී පහන් අළුත්වැඩියා කිරීම සම්බන්ධව ස්තූතිය ප්‍රකාශ කර රණවිරු සුභ සාධක සංගමය, මාපලගම විසින් යොමු කරන ලද 2019.05.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

14. පොල්අතුමෝදර ගඟ ආරම්භක ස්ථානයේ පිහිටි පහත් බිම් තීරුවක් ගොඩකිරීම සම්බන්ධව මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

15. වාහන වෙන්දේසිය සම්බන්ධව උපදෙස් පතා ගා/නාප්‍රාස/ආදා/02 විෂය මගින් යොමු කරන ලද 2019.05.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

16. මාර්ගයක් සඳහා නව බස් රථ සේවාවක් යොදවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, උඩුගම ඩිපෝව මගින් යොමු කරන ලද 2019.05.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

17. ගිංගඟ ඉවුර කැඩීයාමෙන් කැඩී ගිය මාර්ගය ලබා ගැනීම සඳහා ඊ.කේ.එස්.ජයමාන්න මහතා, උඩවැලිවිටිය විසින් යොමු කරන ලද 2019.04.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

18. බැනර් මුද්‍රණය සඳහා වැය වූ මුදල් ලබා ගැනීම සම්බන්ධව ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා විසින් යොමු කරන ලද 2019.05.13 දිනැති ලිපිය සභාගත කරන ලදී

19. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යාකරන මාර්ගය සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පවතින එල් 15888 දරණ නඩු සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ. ලක්රුවන් සම්පත් මහතා විසින් යොමු කරන ලද 2019.05.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ)1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**01.** මාපලගම බස් නැවතුම්පොළෙහි ඇති වෙළඳ සංකීරණය මේ වන විට අපවිත්‍ර වී ඇති බවත්, එහි වහලය අබලන් වී ඇති බවත්, එහි ව්‍යාපාර කරන අය දැණුම් දී ඇති බැවින් එම වෙළඳ සංකීර්ණය පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. තල්ගස්වල පොළ භූමියේ ඇති අප සතු අංක 1,2,3,4,5 කඩ කාමර පරිහරණය කරන බදු කරුවන් විසින් එම කඩ කාමර වැඩි දියුණු කිරීමට ඉල්ලා ඇති බැවින් සභාවේ අධීක්ෂණයෙන් එම කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. මාපලගම මහජන ක්‍රීඩා පිටියේ ළමා උද්‍යානයක් ඉදි කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. උඩුගම උප කාර්යාල භූමියේ ස්ථාපිත පෙර පාසල අසළ ළමා උද්‍යානයක් ඉදි කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. තල්ගස්වල, මාපලගම, නාගොඩ, යටලමත්ත, උඩුගම බාර්හංදිය යන ස්ථානයන්හි ත්‍රිරෝද රථ ගාල් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. ඌරල බෝවිටියමුල්ල බීඩී 5 ඇල්ලේ සහ මලාමුර ඇල්ලෙහි නාන තටාක ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී. පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2019 යටතේ අනුමතව ඇති මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා වෙන්වූ රු. 500000.00 ක මුදලින් ආයුර්වේද මධ්‍යස්ථානයේ වහළ සකස් කිරීමට හා ආයුර්වේද මධ්‍යස්ථානය පාටිෂන් කිරීමට සහ තිර රෙදි යෙදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2019 ප්‍රජා ජල සම්පාදනය යටතේ අනුමතව ඇති නාන තොටුපල සංවර්ධනය කිරීම සඳහා වෙන්වූ රු. 1,000,000.00 ක මුදලින් පහත සඳහන් නාන තොටුපලවල් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

- කැප්පිටියගොඩ අංගහ අසළ තොටුපල සංවර්ධනය
- සෙනවිරත්න මාවත දෙවනිගෙවත්ත ළඟ තොටුපල සංවර්ධනය
- 217 සී ගම්මැද්දේගොඩ අලුත් පාලම අසළ තොටුපල සංවර්ධනය
- නාගොඩ වැල්පාලම අසළ තොටුපල සංවර්ධනය
- නාගොඩ වැලිගොඩවත්ත අසළ තොටුපළ සංවර්ධනය කිරීම
- මාපලගම පාලම අසළ මහ තොටුපළ සංරක්ෂනය
- උනන්විටිය හංදිය තොටුපල සංවර්ධනය
- ගම්මැද්දේගොඩ 217 ඒ උතුර අම්බලන්තොට තොටුපල සංවර්ධනය
- නාගොඩ ඉහළ මුතුගොඩ කඩය අසළ තොටුපල සංවර්ධනය
- ලියනගහවිට තොටුපල එගොඩ සහ මෙගොඩ සංවර්ධනය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. 2019 ඔක්තෝම්බර් මස 01 වන දින පැවැත්වීමට නියමිත ලෝක ළමා දින උත්සවය වෙනුවෙන් රු. 150,000.00 ක මුදලක් සභා අරමුදල් මගින් දැරීමට යෝජනා කරමි.

ඒ වෙනුවෙන් 2019.10.01 වන දිනය පුරාම එළිමහන් ක්‍රීඩාංගනයක ළමා සෙල්ලම් උපකරණ සවි කර දරුවන්ට විනෝද ක්‍රීඩා සිදු කිරීමට අවස්ථාව ලබා දෙන අතර දිනය පුරාම දරුවන්ගේ රසවින්දනය වැඩි දියුණු කිරීමේ රසවින්දනාත්මක වැඩසටහන් හා ළමා ගීත ඉදිරිපත් කිරීමද ඒ අතරට සිදු කිරීමට බලාපොරොත්තු වේ.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. 2019 සැප්තැම්බර් මාසය තුලදී පැවැත්වීමට නියමිත පුස්තකාල පාඨකයින්ගේ සහ බල ප්‍රදේශයේ පාසල් දරුවන් සඳහා පැවැත්වීමට බලාපොරොත්තු වන සාහිත්‍ය නිර්මාණ තරඟාවලිය වෙනුවෙන් රු. 125,000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. එච්.ඩබ්. සන්ධ්‍යා මල්කාන්ති මහත්මියට දසමස් වැටුප් අත්තිකාරම් මුදල ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

12. සංවර්ධන නිලධාරී (පරිසර), කේ.ජී.මානෙල් සුදර්ශනී මහත්මියට ක්ෂේත්‍ර නිලධාරී දීමනාව අනුමත කිරීමට යේජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

13. 252-6478 දරන කැබ් රථයේ රක්ෂණ ආවරණය අලුත් කර ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

14. කාර්යාලය ඇතුලත භාවිතය සඳහා සමාන්තර දුරකථන සම්බන්ධතාවයක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

15. ආදාහන පූජෝත්සව සඳහා නිර්මාණය කරන ලද බැනර් සඳහා වැය වූ රු. 2400.00ක මුදල , වැය අනුමැතියට යොමු කර අනුමැතිය ලද පසු ප්‍රතිපූර්ණය කිරීමට යොජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**16.** උඩුගම උක්ඕවිට පෙර පාසලේ වැරන්ඩය වටා ගඩොල් බැඳ, දැලක් ගසා ආවරණය කර පිළිසකර කිරීමට හා ඒ සඳහා තාක්ෂණ නිලධාරී විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**11.(8) සභා රීති යටතේ කරනු ලබන යෝජනා**

**11.(8) සභා රීති යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

17. පළාත් පාලන කොමසාරිස්ගේ 03/04/02/01 හා 2019.05.08 දිනැති ලිපියට අදාළව 2019 මැයි මස සිට දෙසැම්බර් දක්වා සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා රු. 72000.00 ක මුදලක් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් වැය දැරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**18.** ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

2019.05.14 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.

ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)

**01.2019** මාර්තු මස විදුලි බිල්පත්

| | | |
|---|---|---|
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |

**2019** අප්‍රේල් මස විදුලි බිල්පත්

| | | |
|---|---|---|
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 368.10 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 2656.80 |
| 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 569.40 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1667.40 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 294.90 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1521.00 |
| 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 606.00 |

**02.**ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය ජල බිල්පත (2019.03.22 – 2019.04.22) -රු. 3921.88

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.03.16- 2019.04.15) - රු. 826.47

**04.මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2019.04.25) - රු. 68.86

**05. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
**2019 මාර්තු**
0912296537 - ප්‍රධාන කාර්යාලය (සභාපති නිල කාමරය) - රු. 3092.34
0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 692.63

**2019 අප්‍රේල්**
0912296537 - ප්‍රධාන කාර්යාලය (සභාපති නිල කාමරය) - රු. 3506.09
0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 475.09
0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 7812.41

**2019 මාර්තු සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**
2019.03.01 – 2019.03.31 දක්වා - රු. 2633.89

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. ගංවතුරින් හානියට ප්‍රෙද්ශවල යටිතල පහසුකම් නගා සිටුවීම වෙනුවෙන් අය විය යුතු මුදල් රජයේ ආධාර ගිණුමට බැර කර ඇති බැවින් නැවත එම මුදල පොදු අරමුදල් ගිණුමෙහි තැන්පත් කිරීම -රු.172466.00
ii. SPLO 3592 ලොරි ජල බවුසරය ඩීසල් ලීටර් 10 ක් ලබා ගැනීමේ බිල්පත් ප්‍රතිපූර්ණය - රු. 1000.00
iii. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා, පළාත් පාලන කොමසාරිස් ඇතුළු නිලධාරී මණ්ඩලයට සංග්‍රහ වියදම් බිල්පත මුදල් ප්‍රතිපූර්ණය - රු. 5186.70
iv. LL 7103 ටිපර් රථයේ තත්ව සහතිකය ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 500.00
v. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ට සුළු අක් මුදල් ලබා දීම
එච්.එල්.එන්.පී. කුමාර මයා - රු. 1000.00
ජනිත ඩී ලියනආරච්චි මයා - රු. 1000.00

**07.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. 2019.04.09 තාක්ෂණික කමිටුවට සහභාගි වූ නිලධාරීන් වෙනුවෙන් ගෙවීම - රු. 2500.00
II. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 අප්‍රේල් මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

**08.අතිකාල දීමනා ගෙවීම**

**2019 මාර්තු මස**
චතුරානි පතිනායක මිය - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 792.00

**2019 අප්‍රේල් මස**
බී.ජී. පියතිලක මයා - රියදුරු - රු. 3614.04

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.6886.82 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු.7488.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.4848.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8360.00 |

**09.2019 අප්‍රේල් මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2791.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |
| ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**10.ගමන් වියදම් ගෙවීම**

**2019 මාර්තු මස ගමන් වියදම්**

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| චන්ද්‍රිකා දයාවංශ මිය | - ලේකම් (සමාරම්භක පුහුණුව පළමු අදියර) | - රු.4360.00 |
| එම්.එච්.ෆර්සියා ෆර්වින් මිය | - හිටපු ලේකම් | - රු.2168.00 |
| ජී.කේ. කුසුම්ලතා මෙය | - පෙර පාසල් පාලිකා | - රු.1748.00 |

**2019 අප්‍රේල් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| ඉරේෂා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 914.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු.2800.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 1460.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| චන්ද්‍රිකා දයාවංශ මිය | - ලේකම් (සමාරම්භක පුහුණුව අවසන් අදියර) | - රු.9810.00 |
| ජී.පී.ජී. ශ්‍රීණිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 480.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 810.00 |
| රුචිනි චතුරිකා මිය | - කළමනාකරණ සහකාර | - රු.1760.00 |
| අයි. චතුරි චින්තිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 470.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 878.00 |

**2019 මැයි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 480.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 480.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 1420.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

ඉෂානි දීපිකා ගනේවත්ත මිය - පරිගණක ක්‍රියාකරු - රු. 1760.00
ඩබ්.ඒ.සී. මධුෂානි මිය - කාර්යාල කාර්ය සහායක - රු. 880.00

**11. එම්. එච්. ෆර්සියා ෆර්වින් මිය, හිටපු ලේකම්**

i. නිවාඩු දිනයන්හි රාජකාරි කටයුතු වල නිරිතවීම වෙන්වෙන් දින වැටුප් ගෙවීම (2019/02/17) - රු. 2032.75
ii. නිවාඩු දිනයන්හි රාජකාරි කටයුතු වල නිරිතවීම වෙන්වෙන් දින වැටුප් ගෙවීම (2019-03-09/16/20 යන තෙදින) - රු. 6098.25

**12. එච්.ඩබ්. ප්‍රියන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/04/26) - රු. 504.00
II. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/03/29) - රු. 504.00

**13. යූ.කේ. ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර සාම්පල් පරික්ෂාවට කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට යාම වෙනුවෙන් (2019.03.27) - රු. 800.00

**14. කේ.වී.පී. ඩයස් මයා, සහකාර කළමනාකර ඉංජිනේරු, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය**

නාගොඩ ප්‍රාදේශීය සභාව සතු RD 8569, RD 8570, ට්‍රැක්ටර්වල අළුත්වැඩියාවට පසු වාර්තාව සහ RD 9457 අංක දරණ ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාවට පෙර වාර්තාව වෙනුවෙන් ගෙවීම - රු. 1500.00

**15. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

i. විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

**16.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**<u>2019 මාර්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් - රු. 5200.00

**17. කේ.ජී. ධනසිරි මයා තෙල් පිරවුම්හල, ගා/නාගොඩ**
**<u>2019 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් - රු. 62400.00
LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 225 ක් - රු. 23400.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 225 ක් - රු. 23400.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 150 ක් - රු. 15600.00
LQ 3592 බවුසරය ඩීසල් ලීටර් 70 ක් - රු. 7280.00

**18.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 අප්‍රේල් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

**19.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 අප්‍රේල් - රු.4370.00

**20.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 16242 අදාළව 2019.05.03 කැඳවන ලද නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු , නඩු අංක පී 14658 ට අදාලව 2019.05.06 නීතීඥ පෙනී සිටීමේ ගාස්තු හා නඩු අංක එල් 13814 ට අදාල 2019.05.24 ට නීතීඥ පෙනී සිටීමේ ගාස්තු - රු.11000.00

**21. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. LL 7650 දරණ කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.22030.00
ii. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.17065.00
iii. PA 8570 ට්‍රැක්ටර් රථය සඳහා එන්ජින් ඔයිල් සහ ගියර් ඔයිල් ලබා ගැනීමේ බිලපත - රු. 6450.00

**22. මුතුහෙට්ටිගම සේවා ස්ථානය, උඩුගම**

252-6478 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 11570.50

**23. ඒ.ජේ.ජී. ස්ටේෂනරිස්, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයට 9 ½ x 4 ½ ,ලිපි කවර ලබා ගැනීමේ බිල්පත - රු. 925.00

**24. ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කිරිබත්ගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා වෙබ් අඩවිය අලුත් කිරීමේ වාර්ෂික ගාස්තුව ගෙවීමේ බිල්පත - රු. 7450.00

**25. ඒ.ජී. සුජීව සම්පත්, උඩවැලිවිටිතලාව**

2019.04.09 දින ලීටර් 6000 වතුර ටැංකිය වෙනුවෙන් රු. 6000.00 ක් ගෙවූ නමුත්, ලබා ගත්තේ ලීටර් 4000 වතුර ටැංකිය බැවින් වැඩිපුර ගෙවන ලද මුදල නැවත ලබා දීම - රු. 2000.00

**26. ජී. පී. සඳුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර්, මාපලගම**

i. රැස්වීම් ශාලාවේ ඇති ශබ්ද විකාශන පද්ධතිය සඳහා UPS එකක් සහ ලේකම් නිල කාමරයේ පරිගණකය සඳහා UPS එකක් මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 9400.00

**27. එස්.බී. ප්‍රින්ටර්ස් (පුද්) සමාගම, මීගමුව**

මුද්‍රිත ලේඛන මිළදී ගැනීමේ බිල්පත - රු. 5864.00

**28. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්ගලික සමාගම, පිටිගල**

වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම
( බි. අ. 21618) තම්බලර් ස්විච් - රු.13000.00

**29. රෙනුල ස්ටේෂනර්ස්, ගාල්ල**
ප්‍රධාන කාර්යාලයට 9 x 4 ලිපි කවර ලබා ගැනීමේ බිල්පත - රු. 792.50

**30. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මැයි මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**31.කළමනාකරු, ලංකා බැංකුව, තල්ගස්වල ගි.අ.0004766271ට බැර**
දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2019 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පොදු අරමුදල් ගිණුමට ලැබී ඇති මුදල රජයේ ආධාර ගිණුමට බැර කිරීම -රු.305000.00

**32. දයානි පුද්ගලික සමාගම, මාපලගම**
මාපලගම වෙලද සංකීර්ණයට හා ආයුර්වේදයට ජල සැපයුම සකස් කිරීමට අදාළ භාණ්ඩ මිළදී ගැනීමේ බිල්පත - රු. 5335.00

**33. ටී.ජී. හාඩ්වෙයාර්, නාගොඩ**
සභාපති නිල කාමරය අසල ඇති කාමරයේ විදුලි අවශ්‍යතා සඳහා ලබා ගත් භාණ්ඩයන්හි බිල්පත් ගෙවීම - රු. 3814.00

**34. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
2019 අප්‍රේල් - රු.13000.00

**35. දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම්**
එච්.ඩබ්. සන්ධ්‍යා මල්කාන්ති මිය - රු.230900.00

**36. ආර්.ඒ.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි, නාගොඩ**
2019.05.07 දින පවත්වන ලද ඩෙංගු වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් බිල්පත - රු. 725.00

**37. නිපෝන් වෙයින් ඉන්ටර්නැෂනල් , ගාල්ල**
කොම්පොස්ට් පොහෝර කිරනු ලබන ඉලෙක්ට්‍රොනික තරාදිය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 3300.00

**38. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**
i. 2019 අප්‍රේල් මස 09 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2430.00

**39. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**
i. 2019 අප්‍රේල් මස 09 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු.3240.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන)**
**සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන**
**40. තරිදු කන්ස්ට්‍රක්ෂන්, තලාව පාර, වදුරඹ**

i. ගල්කැටියාගොඩ දේවාල මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා පිළිසකර කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 20000.00

**රජයේ ආධාර**
**පළාත් නිශ්චිත - 2018**
**41. උඩුගම බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය, උඩුගම**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ 10% රැදවුම් නිදහස් කිරීම - රු. 43047.86

**උපමාන පාදක - සංවර්ධන ප්‍රධාන 2016**
**42. එක්සත් සුළු ගොවි සංවිධානය, අලුත් පහළ, මාපලගම**
මාපලගම කුඹුරුහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම කර්මාන්තයේ 10% රැදවුම් මුදල් නිදහස් කිරීම - රු.183685.19

**පසුබට කලාප සංවර්ධන වැඩසටහන - 2018**

**43. උඩුගම නැගෙනහිර ගොවි සංවිධානය, උඩුගම**
අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මිරිස්කන්ද මාර්ගය අවශ්‍ය ස්ථානයන්හි හියුම් පයිප්ප යොදා කාණු කපා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% රැදවුම් නිදහස් කිරීම - රු. 48384.12

**අංක 01 සිට 43 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## 2019.05.14 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව.

01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභව

- LL 7103දරණ ටිපර් රථයේ දුම් පරික්ෂාව සඳහා බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1610.00
- SPRD 1637 ට්‍රැක්ටරයේ රක්ෂණ වාරිකය සඳහා ගාස්තු - රු. 700.00
- SP LL 7650 කෲ කැබ් රථයේ රක්ෂණ වාරිකය සඳහා ගාස්තු - රු. 1300.00
- SPRX 2239 සුදු යකඩ බවුසරයේ රක්ෂණ වාරිකය සඳහා ගාස්තු - රු. 700.00
- SPLL 7103 ටිපර් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ගාස්තු - රු. 7700.00

02. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ

- ❖ නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය පාපිසි මිළදී ගැනීමේ බිල්පත් පියවීම - රු. 850.00
- ❖ නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය සඳහා හීටරයක් මිළදී ගැනීමේ බිල්පත් පියවීම - රු. 390.00

03. දයානි පුද්ගලික සමාගම, මාපලගම

- ❖ නාගොඩ ප්‍රාදේශීය සභාවේ තණකොල කපන යන්ත්‍රය සඳහා අවශ්‍ය උපකරණ මිළදි ගැනීමේ බිල්පත පියවීම - රු. 2050.00
- ❖ නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ අලුතින් ඉදි කරන ලද කොටසට යාබඳව ඇති පුස්තකාල ගොඩනැගිල්ලේ පිංතාරු කිරීම සඳහා පින්සලක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 590.00
- ❖ නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පුස්තකාල කොටසෙහි පිංතාරු කිරීම සඳහා භාණ්ඩ ලබා ගැනීමේ බිල්පත පියවීම - රු.2645.00

**අංක 01 සිට 03 දක්වා ඇති ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

- ➢ **(ඉ).2 කර්මාන්ත යෝජනා**

**ගරු උප සභාපතිතුමා හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. නාවින්න මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා J.C.B.යන්ත්‍රය පැය 05 ක් යෙදවීම
ii. කුඹුරුහේන මාර්ගයේ ඇති වලවල්වලට කොරිපස් දමා වලවල් වසා දීම
iii. පානීය ජල ව්‍යාපෘතියක් සඳහා යටලමත්ත වෙළද සංකීර්ණයේ ඇති ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම
iv. නාවින්න පිට්ටනිය මාර්ගයට වීථි ලාම්පු 03 ක් ලබා ගැනීම

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රිනී නෙළී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. සෙනවිරත්න මාවත අවසානයේ පිහිටි තොටුපල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
ii. අංගහ අසළ පිහිටි තොටුපල මාර්ගය ප්‍රතිසංස්කරනය කිරීම

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන සංශෝධිත යෝජනාව**

ඉසුරු දොඩංගොඩ මන්ත්‍රීතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබා දුන් රු. 20000.00 ක මුදල සඳහා ගම්මැද්දේගොඩ මිරිස්පැලහේන්දෙනිය මාර්ගයට ලබා දුන් යෝජනාව සඳහා එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් ඒ වෙනුවට ගම්මැද්දේගොඩ කන්දකැටිය මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. හඟරන්වල මැණික්දොල කන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 22500.00
ii. ගොඩපීල්ල කන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00
iii. උඩවැලිවිටිතලාව මිල්ලගහ උඩුමුල්ල මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම - රු. 10500.00

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

iv. උඩුගම උක්ඔිවිට පෙර පාසල වැඩි දියුණු කිරීම - රු.340,000.00
v. හෝමදොල තුම්මෝදර ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම - රු. 20000.00

**පෙර පාසල වැඩි දියුණු කිරීමට, ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට අදාලව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

vi. HP 1005 වර්ගයේ ප්‍රින්ටර් දෙක අළුත්වැඩියා කිරීම - රු. 9300.00

**HP 1005 වර්ගයේ ප්‍රින්ටර් දෙක අළුත්වැඩියා කිරීමට අදාලව සවුත්නෙට් පුද්ගලික සමාගම වෙතින් ඉදිරිපත් කර ඇති, ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**01. පරිගණක කඩදාසි සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | රෙනුල ස්ටේෂනර්ස්, ගාල්ල | දුලාර ස්ටේෂනර්ස්, වක්වැල්ල | ඒ.ජේ.ජී. ස්ටේෂනර්ස්, කලුවැල්ල |
|---|---|---|---|
| • 9 1/2X 11 1 ply | රු. 1790.00 | රු. 1725.00 | රු. 1650.00 |
| • 9 1/2X 11 2 ply | රු. 4750.00 | රු. 4695.00 | රු. 4580.00 |
| • 5 1/2X 11 1 ply | රු. 1610.00 | රු. 1500.00 | රු. 1400.00 |
| • 5 1/2X 11 2 ply | රු. 3350.00 | රු. 3250.00 | රු. 3000.00 |
| • 15 X 12 1 ply | රු. 3590.00 | රු. 3400.00 | රු. 3100.00 |
| • 15 X 12 2 ply | රු. 8340.00 | රු. 8200.00 | රු. 7790.00 |

**පරිගණක කඩදාසි ලබා ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඒ.ජේ.ජී. ස්ටේෂනර්ස්, කලුවැල්ල වෙතින් පරිගණක කඩදාසි ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**02.** ***විදුලි පංකා සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | දම්රෝ ප්‍රදර්ශනාගාරය, උඩුගම | හසාරෝ එන්ටර්ප්‍රයිසස්, ගාල්ල | සිංහගිරි ෆර්නිචර්, උඩුගම |
|---|---|---|---|
| • ස්ටෑන්ඩ් ෆෑන් | රු. 7690.00 | රු. 7550.00 | රු. 6900.00 |
| • ස්ටෑන්ඩ් ෆෑන් | රු. 7590.00 | රු. 5390.00 | රු. 5200.00 |
| • සිවිලිං ෆෑන් | රු. 8990.00 | රු. 8990.00 | රු. 8390.00 |
| • වෝල් ෆෑන් | රු. 6890.00 | රු. 7650.00 | රු. 6800.00 |

**ඉහත මිළ ගණන් නියමිත පරිදි පිළිවිතර සඳහන් කර මිළ ගණන් කැඳවා නොතිබූ බැවින් ප්‍රතික්ෂේප විය**

**(ඉ).4 (1) සංශෝධිත මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**03. එස්.බී. ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම මගින් එවා ඇති සංශෝධිත මිළ ගණන් ඉදිරිපත්කිරීම (ඇමුණුමක් ලෙස යා කර ඇත)**

**එස්.බී.ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම වෙතින් ලැබී තිබූ සංශෝධිත මිළ ගණන් යටතේ ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන මුද්‍රිත ලේඛන , මුද්‍රිත පෝරම ප්‍රාස වාර්තා එස්.බී. ප්‍රින්ටර්ස් වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ **2019 අප්‍රෙල් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම**
- ❖ **2019 අප්‍රෙල් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම**
- ❖ **2019 අප්‍රෙල් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම**

## 11.වෙනත් කරුණු :-

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ලේකම්තුමියගෙන් ද, සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ ගරු සභාපතිතුමා විසින් තොටුපළවල් කිහිපයක් හදන බවට ප්‍රකාශයක් කළා. ඒ තොටුපළවල් අතරට කැප්පිටියගොඩ මාර්ගයේ තියෙන අංගහ ගාව තොටුපල, ඊට මෙගොඩහ පැත්තෙ තොටුපළත් සකස් කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම පසුගිය කාලයේ අපේ පුස්තකාලය මගින් ජංගම පුස්තකාල රථයක් ගමන් කළා. හැකිනම් ඒ පුස්තකාල රථය නැවතත් ලබා දෙන්න. ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, අපේ විද්‍යාලයේ අද දවසේ සුවිශේෂී දෙමව්පිය වැඩසටහනකට සම්බන්ධවීමේ රාජකාරිමය අවශ්‍යතාවයක් සඳහා බැහැරවීමට මම අවසර පතනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ප්‍රධාන උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම අවසරයි. ප්‍රථමයෙන්ම දැන් රට අවුලකට පත් කරපු මේ ආණ්ඩුවට අපගේ දැඩි විරෝධය පළ කරනවා. දැනට අවුරුදු හතරකට, පහකට උඩදී අපේ රට තුල ඕනෑම අයෙකුට රු 1ට 2ට වුණත් පාරේ ගමන් කරන්නට හැකියාව තිබුණා. ඒ සඳහා ඉඩ සලසා දුන් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මේ වෙලාවේ අපේ ගෞරවය පුද කරන්න ඕන. එතුමන්ගේ කාලෙන් පස්සේ, මේ යහපාලන ආණ්ඩුව විසින් මේ රට විනාශය කරා ගමන් කරන වෙලාවක් තමයි දැන් තියෙන්නෙ. මේ ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරුන්ගේ ආරක්ෂාව විතරක් සපයාගෙන, පුංචි දරුවන් බිල්ලට දෙන මේ ආණ්ඩුවට දැඩි විරෝධය පළ කරන්න ඕන. මම හිතන්නේ දැනට ගරු සභාපතිතුමාටවත් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන පාසලකටවත් දෙමව්පිය අවසරයකින් තොරව යන්න බැරි තත්ත්වයක් තියෙනවා. අපි පක්ෂ භේදයෙන් කතා කරනවා නෙවෙයි. නමුත් ලස්සනට තිබුණු මේ රට විනාශ කළේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ යහපාලන ආණ්ඩුව සහ ආණ්ඩුවේ මැති ඇමැතිවරු සියලු දෙනා ම එකතු වෙලා. ඒ අය මේකට වග කියන්න ඕන. මේ ප්‍රාදේශීය මට්ටමේ ඉන්න මන්ත්‍රීවරුන්ට, ඇත්තටම කතා කරලා වැඩක් නැහැ. එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඒ සියලුම ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් ලොකු කලකිරීමකින් තමයි ඉන්නේ. ඉහලට මේ පණිවිඩය ගෙන යන්න පුලුවන්නම්, ඒ ගැන ඉහලට දැනුම් දේවි. දැන් රටේ 300, 400 ක් පමණ මිය ගිහිල්ලා, ඒ වගේම හාර පන්සීයක් රෝහල් ගත වෙලා ඉන්න වෙලාවේ අපිට මැතිවරණයක් තියලා ජයග්‍රහණය කරනවයි කියන එක කතා කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ මියගිය සියලු දෙනාට අපගේ සංවේගයත්, රෝගාතුර වූ සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන එකත් තමයි අපි කරන්න ඕන. නමුත් මේ යහපාලන ආණ්ඩුව ඔවුන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් දැනටත් කට හොල්ලන්නෙ නැතුව, කිසි දෙයක් කරන්නෙ නැතුව, මේකත් අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට පෙරලන්න උත්සාහ දරන ආණ්ඩුවක් තියෙන්නේ. මම මෙහිදී මෙතන ඉන්න එක්සත් ජාතික මන්ත්‍රීවරුන්ට චෝදනා කරන්නේ නැහැ. ඔවුන්ට පුලුවන්නම්, ඔවුන් මේ ගරු අගමැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂය ඉහළ නිලධාරීන්ටත් කතා කරලා කියාවි. අපිත් ඉවර කරන්නේ නැතුව රටත් ඉවර කරන්නේ නැතුව ඔය ඇමතිකම්, අගමැතිකම් දාලා ගෙදර යන්න කියලා. නමුත් එක කියන්න බැරි තත්ත්වයට අද මෙතන ඉන්න එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු පත් වෙලා ඉවරයි. අපි සියලු දෙනාම මේ ආණ්ඩුව පලවා හරින්න කටයුතු කරන්න ඕන.

නැත්නම් ඉදිරි පරම්පරාවට රටක් නැති වෙනවා. ඒ නිසා තමන්ගේ බඩගෝස්තරය පුරවගන්න මෙතනට ඇවිල්ලා, අපි හයියෙන් කෑ ගහලා වැඩක් වෙන්නේ නැහැ. අප සියලු දෙනාගේ ඇඟේ දුවන්නෙ එකම ලේ. ඒ ලේ වලට පාටක් නැහැ. ඒ නිසා පුහුමතයට යන්නේ නැතුව අපි මෙතන ගිරිය පුප්පගෙන කෑ ගහන් නැතුව අපි සියලු දෙනා එකට එකතුවෙලා කටයුතු කරමු. මෙතුමන්ලා ඡන්දෙ දීලා, ආණ්ඩු හදාගෙන අද එතුමන්ලටත් රෑ 9.00 ය වෙද්දි එළියට බහින්න බැරි තත්වෙට පත්වෙලා, දොරවල්වල ලොක් දාගෙන ඉන්න වෙලා තියෙනවා. ඒ වගේම ඉල්ලීමක් කරන්නේ අපේ රටේ පුංචි දරුවන් ආරක්ෂා කරලා දෙන්න. ඒ වගේම අපේ අහිංසක රණවිරුවන් නැත්නම් අද අපි කොහෙද දන්නෙ නැහැ. අපිම කතිරේ ගහලා ඉහලට යවලා මේ මැති ඇමැතිවරු ඔවුන්ගේ ආරක්ෂාව තර කරගෙන, අපේ අහිංසක තරුණ පිරිස මරා දමන්න තමයි මේ උපක්‍රමශීලී වෙන්නේ. මුස්ලිම් දෙමළ සිංහල ප්‍රශ්නයක් නෙවෙයි තියෙන්නෙ. නමුත් මම නැවතත් අපේ සියලුම මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයට දැඩි විරෝධය පළ කරනවා. ඒ වගේම අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඔවුන්ගේ ප්‍රශ්න විසඳාගන්න එක විතරයි කරන්නේ. මම එක්සත් ජාතික පක්ෂයේ ජේෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ එක්සත් ජාතික පක්ෂයේ ඉහළ මැති ඇමතිවරුන්ට මෙහෙම දේවල් කරන්න එපා කියලා ඉල්ලීම් කරන්න. නැත්නම් අපට වගේම ඔබටත් අපේ කියලා රටක් නැති වේවි. අපි මේ අවස්ථාවේ දී මැතිවරණ ගැන කතා නොකළත්, ඉදිරියේ දී පැවැත්වෙන මැතිවරණවලින් අපගේ රටට හොඳ නායකයෙක් ලෙස අපේ රට ලස්සන රටක් කරන්නට පුළුවන් වෙන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට පමණයි. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ප්‍රධාන මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුලූ සියලූ දෙනාත් එක්ක ඉදිරියේදී අනිවාර්යයෙන්ම අපි අපේ එක්සත් ජාතික පක්ෂය විසින් විනාශ කරපු රට සුන්දර, ලස්සන රටක් බවට පත් කරනවා. එහිදී එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන් තමන්ගේ පටු අරමුණු මුදුන්පත් කර ගෙන මෙතන කෑ ගහන් නැතුව අපි විසි හත් දෙනාම එකතුවෙලා එක පැත්තකට ඇවිල්ලා, අපේ රට ජාතිය බේරගන්න කියන ඉල්ලීම කරනවා. එක්සත් ජාතික පක්ෂය අත්හැරලා අපිත් එක්ක එකතු වෙලා එක රටක ලස්සනට සිංහල දෙමළ මුස්ලිම් සියලු දෙනා එක හා සමානව ජීවත් වන්නට පුළුවන් රටක් හදන්නට ඔබතුමන්ලාටත් ඉතා ගෞරවයෙන් ආරාධනා කරනවා. ඒ වගේම අපේ රටට ඉක්මනින්ම සාමය උදාවේවා කියන ප්‍රාර්ථනයත් සිදුකරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි කතා කරන්න ඕන ජනතාවගේ උපතේ සිට මරණය දක්වා ජනතාවට අපි කරන්න ඕන කටයුතු මොනවද කියන එක. එතැනදී අපට සිහියට නැගෙනවා. මේ පාස්කු ඉරිදා සිදුවුන මිලේච්ඡ ප්‍රහාරය අපිත් හෙළා දකිනවා. ඒ වගේම තමයි මගේ සහෝදර සමන් මන්ත්‍රීතුමා කිව්වා. ජේවීපී එකේ වුනත් මන්ත්‍රී හොඳයි කියන අදහස මම ඒකට එතුමාට ගරු කරනවා. මම ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන්න තමයි. නමුත් මම හිතන්නේ මට වැටහුණ ආකාරයට, එතුමාගේ අදහස වෙන්න ඇත්තේ ප්‍රහාරයේදී අපේ ජාතික ලැයිස්තුවේ සිටි මන්ත්‍රී කෙනෙක් ගේ සම්බන්ධය වෙන්න ඇති. තාත්තා තමයි අපේ ජාතික ලැයිස්තුවේ හිටියේ. ඒ දරුවන් කරන වැරදි තාත්තගේ පිටින් යවන්න බැහැ. නමුත් අපි ඒ වැරැද්ද කළා නම් ඒ වැරැද්දට දඬුවම් දෙන්න කියලා අපි රජයෙන් ඉල්ලලා තියෙනවා. අපි දෙන සියලුම තොරතුරු මාධ්‍යයෙන් පිටට එන්නේ නැහැ. ඒකයි ඔබතුමන්ලාට ජනතා විමුක්ති පෙරමුණ ගැන වැටහීමක් නැතුව ඇත්තේ. අපේ නායකතුමා ඇතුළු සියලු දෙනාම මාධ්‍යයට ප්‍රකාශයක් ලබා දෙනවා. නමුත් මාධ්‍ය අවහිර කරලා තියෙන්නෙ. දැන් අපට ෆේස්බුක් යන්නත් බැහැ. තොරතුරු පනත තිබුනට තොරතුරු ගන්න බැහැ. සැබෑ තත්වය එළියට ගේන්න අපි කතා කළාට ඔබතුමන්ලාට දැනගන්න ක්‍රමවේදයක් නැහැ. අපි ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වගේම තමයි, ගරු සභාපතිතුමා, ඔබතුමා ගිය මාසේ සභාව වෙලාවෙදි කිව්වා තල්ගස්වල තියෙන අනවසර මාළු ලැලි අයින් කරනවා කියලා. තවම කිසිම ලැල්ලකට අතවත් තියලා නැහැ. සමහරු අපෙන් අහනවා අපිත් මාළු ලැල්ල කොන්ක්‍රීට් වලින් හදාගන්නද කියලා. ඉතින් අපිට දෙන්න උත්තරයක් නැහැ. ඇත්තටම අසරණ මිනිස්සු එතන ඉන්නේ. ඒ මිනිස්සු තවත් ඉදිරියට මෙවැනි ඉදිකිරීම් කරාවි. ඒ වගේ දේවල් අතපසු වෙනවා නම් වැඩක් නැහැ. ඒ ගැන සොයා බලා කටයුතු කරන මෙන් මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම තමයි සභාපතිතුමා ප්‍රකාශ කල යෝජනාව, ඩෙංගු මර්දනය කිරීමේ වැඩසටහන 215බී අලුත් පහල බටහිරටත්, අපි ශ්‍රමදාන මට්ටමින් වැඩපිළිවෙළක් යොදාගෙන තියෙනවා. ඒ සඳහා ඔබතුමා අපට උපකාර කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමා, වෙසක් පොහොය ලග ලගම එන නිසා නාවින්න ක්‍රීඩාපිටියට වීදි ලාම්පු දෙකක් තුනක් සවි කරල දෙන්න කියල මම ඉල්ලා සිටිනවා. ඒ ගැන පියල් මන්ත්‍රීතුමත් කියන්න ඇති.

ඒවගේම අපි කිසි කෙනෙක් මේ ගැටුමේදී බොරදියේ මාළු බෑමට සූදානම් වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ සමන් මන්ත්‍රීතුමා කිව්ව කතා ටික හරි. ඒ දේ මටත් සිදු වුණා. මොකද ඊයේ අපේ පුතා දියතලාවෙ ඉඳලා ආවේ. රාත්‍රී 9.00 ට ඇඳිරි නීතිය දැම්ම නිසා එදාට එන්න විදියක් නැහැ. මම රෑ 12ට දරුවා එක්ක එන්න ගාල්ලට ගියා. ස්ථාන දෙකක දී මාව පරීක්ෂා කිරීම් කටයුතු වලට ලක් කළා. මේ වගේ තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒ වගේම අපේ ළමයි පාසල් ගිහිල්ලා බයෙන් තමයි ඉන්නේ. අපේ දෙමාව්පියන්ට ආරක්ෂක කටයුතු කරන්න බැහැ. රජයෙන් තමයි ආරක්ෂාව ලබා දෙන්න ඕන. අපි දන්නවා අමාත්‍යාංශවලින් සල්ලි දීලා කවුද මේක කළේ කියලා. නමුත් අපි ඒවා මෙතන කියන්නේ නැහැ. අපි කියන්නේ මේ මොහොතේ අපි සියලු දෙනා එකට එකතු වෙලා, මේ ම්ලේච්ඡ ප්‍රහාරය මෙතනින් එහාට නොයන විදියට වැඩ පිළිවෙළක් කරගෙන, සර්ව සාධාරණ සමාජයක් ගොඩනැගීමට සියලු දෙනා එකට එකතු වෙලා වැඩ කටයුතු කරමු යැයි ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේ මම නැගී සිටියේ දීර්ඝ වශයෙන් කරුණු කාරණා සභාව හමුවේ තියන්න නෙවෙයි. විශේෂයෙන්ම අපේ සමන් මන්ත්‍රිතුමාගේ ප්‍රකාශය පිළිබඳව තවදුරටත් කරුණු දැක්වීමක් කරන්නත් නෙවෙයි. අපි සභාවක් වශයෙන් රට ව්‍යසනයට පත් වී ඇති මේ අවස්ථාවේදී, ඇති වුණ සිද්ධියෙන්, මියගිය සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරන්නත්, රෝහල් ගත වුණ අයට ඉක්මන් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරන ගමන්ම, රෝගීව සිට රෝහලෙන් බැහැරව ගිය ජනතාව වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඊලඟට මම සඳහන් කරන්න කැමැතියි. ඔබතුමා මේ සභාව ආරම්භක අවස්ථාවේදී සභාවට ලිපියක් යොමුකළා. ගම්පෙරළිය මාර්ග කිහිපයක් සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලලා. දැනටමත් වැඩ අවසන් කරපු මාර්ග සඳහා අපෙන් අනුමැතිය ඉල්ලනවා. මේ වැඩපිළිවෙල මොකද්ද දන්නෙ නැහැ. දැනටමත් උඩලමත්ත ප්‍රදේශයේ ගම්පෙරළිය මාර්ග කිහිපයක් වැඩ අවසන් කරලා, මේ අවස්ථාවේ මූලික ගෙවීම් වලටත් ඇවිල්ලා, ඒ ගෙවීම් ලබා ගත්ත කිහිප දෙනෙකුත් ඉන්නවා. ඉතින් මම අහන්නේ ඒ ක්‍රමවේදය මොකක්ද? අපට එම ලිපිය යොමු කළේ ප්‍රාදේශීය ලේකම්තුමියද, නැත්නම් වෙන ආයතනයකින්ද කියලා මම දන්නේ නැහැ. නමුත් අපෙන් අනුමැතිය ඉල්ලන කොට ඒවා වැඩ අවසන් වෙලා. නමුත් මේවා අධීක්ෂණය කළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේවත් අපේ ප්‍රාදේශීය සභාවේ වත් කාර්මික නිලධාරීන් නෙවෙයි. ගාල්ලෙන් ඇවිල්ලා. ඒ නිසා ඒ ක්‍රමවේදය කෙරෙහි ඔබතුමා අවධානය යොමු කරන්න. දැනට සංවර්ධනය කරපු පාරවල් ටික වෙනුවෙන් මේවට ලිපියක් උත්තර යවනවා නම්, ඔබතුමා කියන්න මේ මාර්ග දැන් අප නොදැනුවත්වම සංවර්ධනය වෙලා

අවසන් කියලා. මේ දැන් අපෙන් අනුමැතිය ඉල්ලන්නේ මොකටද කියලා. ඊළඟට සමහර ස්ථාන කීපයක් තිබුණා. පුද්ගලික බෝක්කු ඉදිකිරීම්. ගම්පෙරළිය යෝජනාවක් යටතේ උඩලමත්තේ යූ. ජී. බැස්ටියන් කියන මහත්මයාගේ නිවසට යන පාර, ඒක පුද්ගලික පාරක්. ඒ පාරෙන් ගමන් කරන්නේ ඒ මනුස්සයා විතරයි. නමුත් බෝක්කුවක් ඉදිකරන්න අනුමැතිය ඉල්ලා තිබුණා. මේවා කොහොම තෝරගත්තද මම දන්නේ නැහැ. මේවට මැදිහත් වුණ දේශපාලන නායකත්වය ප්‍රාදේශීය සභාවෙ ඉන්නවනම්, නැත්නම් ගම්වල ඉන්නවනම්, නැත්නම් වෙනත් යෝජනා කරපු අය ඉන්නව නම් මේවා මොන විදිහටද සිදු කළේ. රජයේ මුදල් එහෙම පරිහරණය කරන්න බැහැ. ඒවටත් ඔබතුමාගෙන් අනුමැතිය ඉල්ලලා සංවර්ධනය කරන්න ලේස්ති වෙනවා නම් අපි ඒකට විරෝධතාව ප්‍රකාශ කරනවා. එම තෝරා ගැනීමේදී පොදු අරමුණක්, ජනතාවට සේවයක් වන, ඒ වගේම පුද්ගලික නොවන දේවල් තෝරගන්න කියලා මම යෝජනා කරනවා.

දැනට කැඩී බිඳීගිය යටලමත්ත කනත්තගොඩ පාලමේ පාලම් ඇන්ද ප්‍රාදේශීය සභාවෙන් මුදල් වෙන් කරලා සකස් කළේ. ඒ වැට අපට අයත් වැටක්. ඒ නිසා පරණ යකඩ වලට හරි විකුණන්න හරි මෙහෙට ගේන්න පුළුවන් නම් ගෙනත් දාන්න. නැත්නම් අපි දන්නවා පාලම් පිටින්ම උස්සපු කට්ටිය ඉන්නවා. සමහර පාලම් ගලවලා තියපුවම, අයිතිකාරයෝ වගේ අරන් ගියපු තැනුත් තියෙනවා. කළු කඩයට තමයි ඒවා ගියේ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඊළඟට මාළු වෙළෙඳ පොළවල් දැන් ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. අවස්ථා කිහිපයකදි කිව්වත් තවම මේ සඳහා විසඳුමක් හොයාගන්න බැරි වෙලා තියෙනවා. මම මේ දැන් කතා කළේ අපේ අහල පහල ඉන්න මන්ත්‍රීවරුත් එක්ක. අපට පුළුවන් නම් ස්ථාන කිහිපයක තල්ගස්වල, මාපලගම, නාගොඩ, යටලමත්ත වැනි ස්ථානවල මාළු ලැලි වෙනුවෙන් වෙළෙඳ පොළවල් සකස් කරලා, නැත්නම් වාර්ෂික බදු ක්‍රමයක් යටතේ වෙළඳ බලපත්‍රයක් නිකුත් කරලා, ඔය ගැටලුව විසඳන්න පුළුවන්. අපි මෙතන මොන ප්‍රකාශ කළත්, වෙළඳාම් කරන අයට ඒ අයිතිය තියෙනවා. නමුත් අපට තියෙන එකම අයිතිය වෙළඳාමට බලපත්‍රයක් ලබාගැනීමේදී, බදු මුදලක් ගෙවීමේ තියෙන අයිතිය. ඒ නිසා ඉදිරි වර්ෂය තුළ මාළු වෙළඳාම සඳහා විශේෂිත වූ තල්ගස්වල දෛනික මාළු වෙළෙඳපොළත්, මාපලගම දෛනිකව විකුණන කඩයත්, ඒ වගේම නාගොඩ, බාර්හන්දිය වගේ ස්ථාන වලින් විශේෂ මුදලක් ලබාගැනීමට අපට හැකියාවක් තියෙනවා. එහෙම පටන් ගත්තොත් අපට පුළුවන් නගරාශ්‍රිතව තවත් අය තාවකාලිකව නම්, ඉවත් කරන්න. දැන් මාපලගම තියෙන මාලු කඩ දෙක තුනෙන් අපෙන් විශේෂ වෙළඳ බලපත්‍රයක් අරගෙන, නැත්නම් අපේ අනුමැතියකින් ඒක කරගෙන යනවනම්, තවත් කෙනෙකුට එතන වෙළඳාම් කිරීමෙන් ඉවත් කරන්න අපට පුළුවන්. ඔබතුමාට ඒ සඳහා බලය තියෙනවා. ඒ වගේ පියවරක් ගමු කියලා, මම මේ අවස්ථාවේ දී යෝජනා කරනවා.

ඒ වගේම ඔබතුමා ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධව, ටී.ජී. සුමනසිරි මහත්මයා යොමු කරන ලද ලිපියක් සභාව හමුවේ තැබුවා. ඔහු ඉල්ලන්නේ නාගොඩ රෝහල අසල තියෙන අපේ ගොඩනැගිල්ල. ඕක දුන්නොත් අපට ප්‍රශ්නයක් එනවා. අපට උඩුගම උප කාර්යාලය PRD එකට ඔවුන්ගේ කාර්යාලයක් පවත්වාගෙන යන්න දෙන්න බැරි වුනේ අපේ අයිතිය නැති නිසා. මේ ගොඩනැගිල්ල හදලා තියෙන්නේ රක්ෂිතයේ. මහපොළට හදපු රථගාල තමයි ඔතන තියෙන්නෙ. කවුරුහරි විරුද්ධ වුණොත් අපි කොහොමද ඕකට මුදල් ගන්නේ. ඕවා ඔඩිට් වෙනවා. එහෙම ඔඩිට් වෙන්නෙ නැත්නම් ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන අවධානය යොමුකරලා වැඩකටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට පොල්වතුමෝදර ගහ ආරම්භක ස්ථානයේ පහත් බිමක් ගොඩකිරීමක් සම්බන්ධව සභාවට එවපු ලිපියේ අන්තර්ගතය වෙන්නේ, මේ ගොඩකිරීම නිසා පරිසර හානියක් වෙනවා කියන එක. ඒක නිසා අපේ නිලධාරියකු යොමු කර පරික්ෂා කරල බලන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ

වගේම ඔබතුමාගේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ, තල්ගස්වල පොළ භූමියෙ කඩ කාමර කීපයක් අළුත් වැඩියා කිරීම සඳහා ලැබී ඇති ඉල්ලීමක් අනුව යෝජනාවක් ඉදිරිපත් කළා. මේකෙදි මුලින්ම කරන්න ඕන. බදුකරු කවුද කියලා හඳුනාගැනීම. මොකද කඩේ පාවිච්චි කරන්නේ එක්කෙනෙක්. බදුකරු තව කෙනෙක්. ඉස්සර වෙලා මේවා නිරාකරණය කරගෙන කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වෙනවා. මොකද මාපලගම විද්‍යාතිලක පිරිවෙන් මහා විහාරාධිපති අපේ මාපලගම ලොකු හාමුදුරුවෝ හදිසියේ අපවත් වුණා. ප්‍රාදේශීය සභාව හැටියට ගරු සභාපතිතුමන් සහ සියලු මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙලා ඒ අවශ්‍ය සහයෝගය අපට ලබා දුන්නා. ප්‍රදේශවාසීන් සහ විහාරස්ථානය වෙනුවෙනුත් සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට මම ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම ආයුර්වේදය සහ පුස්තකාලය අළුත්වැඩියා කරන්න ලක්ෂ 5ක මුදලක් අනුමත වෙලා තියෙනවා. මාපලගම ආයුර්වේද ගොඩනැගිල්ලේ වහල දිරාපත් වෙලා තියෙන්නෙ. පුස්තකාලයේත් අඩුපාඩු තියනවා. ඒ නිසා ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු යොදවලා ඒ වහල ප්‍රතිසංස්කරණය කරන්න කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා. සෙවිලි තහඩු යොදලා අළුත්වැඩියා කළොත් අපට දීර්ඝ කාලයක් කරදරයකින් තොරව මේ ගොඩනැගිල්ල පාවිච්චි කරන්න පුළුවන් වේවි.

ඒ වගේම මාපලගම වෙළඳ සංකීර්ණය පිළිබඳව කතා කළොත්, ඒකෙත් වහලෙ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. මම ඒ ගැන සභා වාර කීපයකදී ම කතා කළා. උඩ තට්ටුවේ සමහර වෙළෙඳ කුටි ටෙන්ඩර් මගින් අරගත්තත්, ඒ වෙළෙඳ කුටි පාවිච්චි කරන්නේ නැහැ. මොකද ඒ කඩ කාමර තෙමෙන නිසා. ඒ මිනිසුන් කඩ කාමර පාවිච්චි නොකළත්, බදු මුදල් සභාවට ගෙවනවා. ඒ නිසා යම් කිසි ගැටළුකාරී තත්වයක් තියෙනවා. ඒ වගේම පහුගිය දවස්වල හිඟ කඩකුලී එකතු වෙලා තියෙද්දිත් සභාවේ අපේ ආදායම් පරිපාලකතුමා ඇතුළු නිලධාරීන් ගිහිල්ලා මේ මුදල් නොගෙව්වොත් මේ කඩ කාමර නැවත සභාවට පවරගන්නවා කියලා, කියලා තියෙනවා. ඇත්තටම අපි මෙහිදී සානුකම්පිත වෙන්න ඕන. මොකද ඒ මිනිස්සු කඩ කාමර පාවිච්චි නොකරත්, ඒ අයට හැකි ආකාරයෙන් මේ සභාවට ගෙවීම් කටයුතු සිදුකරනවා. එම නිසා මේ කඩ කාමර වල වහල සකස් කරලා දුන්නොත් එතුමන්ලට සහනයක් සැලසෙයි. ඒ නිසා ඒ කටයුත්ත ඉෂ්ට කරල දෙන්න කියල මතක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, නාන තොටුපලවල් සකස් කිරීමට ලක්ෂ 10ක මුදලක් පළාත් සභාවෙන් අනුමත වෙලා තියෙනවා. මේ නාන තොටුපළවල් වලට විශාල මුදලක් යන්නේ නැහැ. තියෙ තොටුපලවල්ම නවීකරණය කරන්න තියෙන්නෙ. පොඩි මුදලකින් අළුත්වැඩියා කරන්න පුළුවන්. සමහර තොටුපළවල්වලට තමයි ලොකු මුදලක් වැයවෙන්නෙ. මාපලගම මංසන්ධියේ එගොඩ මෙගොඩ තොටුපොළවල් දෙකක් තියෙනවා. මම ඇතුළු අපේ ජයවීර මන්ත්‍රීතුමා දිගින් දිගටම ඒ ගැන කතා කලා. ඉල්ලීම් කළා. ඒ තොටුපළවල් දෙකටම ලොකු මුදලක් වැය කරන්න අවශ්‍යතාවයක් වෙන එකක් නැහැ. අඩියෙ තියෙන ගැලවිච්ච ගල් ටික හරියට සකස් කරලා, සාමාන්‍ය මුදලකින් ඒ තොටුපළවල් දෙකම නවීකරණය කරන්න පුළුවන්. මේවා ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද කියලා අපි දන්නෙ නැහැ. ටෙන්ඩර් කරලද? නැත්නම් සභාවේ කම්කරුවෝ යොදවලාද? කොහොම නමුත් පැහැදිලි ක්‍රමවේදයක් යටතේ ඔය මුදලින් උපරිම ප්‍රයෝජන අරගෙන අපි වැඩි තොටුපළවල්

ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරමු. මොකද ගිං ගඟ ආශ්‍රිතව එ තොටුපළවල් වල අවශ්‍යතාවය දැඩිව තියෙනවා. ඒ නිසා ඒ කටයුත්ත කරන්න කියලා මම මේ වෙලාවේ සිහිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දීර්ඝකාලීන ප්‍රශ්නයක් තියෙනවා. සභාවට අයත් අතුරු මාර්ග වල දැන් කාලයක ඉඳලා යන්නත් බැරි තරමේ වල් බිහිවෙලා තියෙනවා. සභාවෙත් කම්කරුවෝ ඉන්නේ කිහිප දෙනයි. මේ ඉන්න පස් හය දෙනාගෙන් සභාවට ලැබෙන කාර්යයන් දිහා බැලුවම, ඒවගේම මල ගෙවල් වල, විවිධ උත්සව වලට ඒ කම්කරුවන් යොදවන්න වෙනවා. ඉතින් අපි මේ සභාවේ කාර්යය වේගවත් කරගන්න නම්, දැනට පළාත් සභාව, මහා මාර්ග සංවර්ධන අධිකාරියේ වගේ ආයතන තණකොළ කපන්නෙ තණකොළ කපන මැෂින් වලින්. අපේ සභාවෙ තණකොල කපන මැෂින් තුනක් තියෙනවා. තව මැෂින් දෙකක් අරගෙන අතුරු මාර්ග පිළිසකර කටයුතු කරන්න පුළුවන් වුණොත් හොඳයි කියලා මම යෝජනා කරනවා. අඩුම ගානේ අත්‍යවශ්‍ය දැඩි ඉල්ලීම් තියෙන මාර්ග හරි ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කරන්න කියලා සිහිපත් කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, සභාවට මිළදී ගන්න විවිධ ඉලෙක්ට්‍රොනික් උපකරණ හා වෙනත් උපකරණ මිලදී ගැනීමේ ක්‍රමවේදයක් තියෙනවා. අඩුම ලංසුව ඉදිරිපත් කරපු ආයතනයෙන් තමයි මිළදී ගන්නේ. හැබැයි මෙතනදී සියළු මන්ත්‍රීවරුන් කතා වුණා. මේ ගන්න උපකරණ වල ප්‍රමිතිය, ගුණාත්මක භාවය කොහොමද කියලා අපි බලන්නේ නැහැ. අඩුම මිල ගණන්වලට තමයි භාණ්ඩ ලබා ගන්නේ. සභාවේ කාර්මික නිලධාරි මහත්වරු ඉන්නවා, ප්‍රසම්පාදන කමිටුව තියෙනවා. මේ කමිටුව හරහා හොඳ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කරන්න. මිල වැඩි වුණත් කමක් නැහැ. හොඳ උපකරණ මිලදී ගත්තම අපට වැඩි කාලයක් පාවිච්චි කරන්න පුළුවන්. අඩු මුදලට තියෙන භාණ්ඩ ගත්තම, අවුරුද්දෙන් දෙකෙන් අයින් කරන්න වෙනවා. ඉක්මනට විනාශ වෙලා යනවා. මිලගණන් කැඳවපු ඉලෙක්ට්‍රොනික ෆෑන් වුණත් එහෙමයි. ඉතින් අපි සභාවේ බොහොම අමාරුවෙන් එකතු කරගන්න සල්ලිවලින් හොඳ ගුණාත්මක භාණ්ඩ ලබා ගත යුතුයි කියලා මම සභාවට යෝජනා කරනවා.

ඒ වගේම සභාපතිතුමනි තව දෙයක් කියන්න ඕන. වෙසක් පෝය ළඟ ළඟම එනවා. අපි බෞද්ධාගමිකයන් හැටියට අපට තියෙන උතුම්ම පෝය. මෙවර ඇති වෙලා තියෙන තත්ත්වයත් සමග අපි වෙසක් පෝය ඉහළින්ම සැමරීමට බලාපොරොත්තු වෙනවා. සභාපතිතුමනි, මම යෝජනා කරනවා අපේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රධාන මංසන්ධි, බෞද්ධ කොඩි වලින් සරසන්න. සමහර විට ඒ නගරවල තියෙන වෙළෙඳ සංගම් වලින් ඒව කෙරෙනවා ඇති. නමුත් එහෙම නොකරන ස්ථානවල අපි ප්‍රාදේශීය සභාව හැටියට වෙසක් සැරසිලි වලින් අලංකාර කරන්න හැකි නම් ඉතාම හොඳයි. මොකද දැන් හැම කෙනෙක්ම තේරුම් අරන් තියෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය තමයි උතුම්ම ධර්මය. ධර්මය අනුව කටයුතු කරනවා නම් කාටවත් වරදින්නේ නැහැ. ඒ නිසා අපි ප්‍රාදේශීය සභාව හැටියට කරන්න පුළුවන් උපරිම මෙහෙවරක් කරල වෙසක්, පොසොන්, ඇසළ යන පෝයවල් සැමරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් අපේ ජයවීර මන්ත්‍රීතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන් කිව්ව වගේ තුන්සියයකට අධික අපේ ලාංකීය ජනතාව ජීවිතක්ෂයට පත්වුණා. රටක් හැටියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හැටියට අපි දැඩිව ශෝක වෙනවා. හැබැයි මේ වන විට ඒ තත්ත්වය ක්‍රමයෙන් පහව යනවා. අපේ ත්‍රිවිධ හමුදාව, පොලිසිය ඉතාම ශක්තිමත්. ඒ අය කළ මෙහෙවර නිසා අද රට යම් ස්ථාවර තත්වයකට පත් වෙලා තියෙනවා. මේක ලෝක ත්‍රස්තවාදය එක්ක සම්බන්ධ ප්‍රශ්නයක්. පහුගිය කාලේ තිබුන එල්ටීටීඊ ත්‍රස්තවාදය වගේ නෙවෙයි. ඊට වඩා බලවත්. නමුත් අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු අපේ රජය හැකි උපරිම කටයුතු යොදලා මේ වන විට එය මර්දනය කරලා තියෙනවා. සමන් මන්ත්‍රීතුමා කිව්වා වගේ දෙමව්පියන්

පාසල් වලට ළමයි යවන්නෙ නැහැ. නමුත් පාසල්වලට අවශ්‍ය උපරිම ආරක්ෂාව යොදවල තියෙනවා. අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය මේ වෙනුවෙන් කැප වෙලා ඉන්නවා. නමුත් අපේ ප්‍රදේශ වල විවිධ කටකතා පැතිර යන නිසා ජනතාව බියෙන් හා සැකෙන් තමයි සමාජය දිහා බලන්නෙ. හැබැයි මීට වඩා ලොකු ත්‍රස්තවාදයක් මීට අවුරුදු දහයකට උඩදී තිබුණා. හැබැයි ඒ ගැන කතා කළේ නැහැ. හැම කාලෙදිම යම් යම් උවදුරු රටට ඇති වෙනවා. ගංවතුර, නායයෑම් වගේ විවිධ දේවල් ඇතිවෙනවා. මේ තත්ත්වය අද ඊයෙක නෙවෙයි. දැනට අවුරුදු දහයක් පහළොවක් තිස්සේ සැලසුම් කරලා, මුස්ලිම් අන්තවාදීන් විසින් ඇති කරගන්න යන ඉස්ලාම් රාජ්‍යයක් යන මනඃකල්පිත ප්‍රශ්නයක්. ඒ අයට ඒක ඉටු කරගන්න ලැබෙන්නේ නැහැ. ඒකට අපේ අග්‍රාමාත්‍යතුමා ඉඩ තියන්නේ නැහැ. අපි පක්ෂයක් හැටියට අපේ රටේ අපට ඡන්දය දුන් නොදුන් සෑම දෙනෙක්ම ආරක්ෂා කරන්න බැඳිලා ඉන්නවා. තමුන්නාන්සේලා කිසි දේකට බය වෙන්න එපා. දකුණු ආසියාවෙ ඉන්න බුද්ධිමත්ම ශ්‍රේෂ්ඨ නායකයෙක් තමයි අපේ පක්ෂේ නායක, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමාගේ ජාත්‍යන්තර ශක්තිය, සහයෝගය එක්ක අද වන විට ඇමෙරිකාවෙන්, ජපානෙන්, චීනෙන් විවිධ තාක්ෂණික ක්‍රමවේද විවිධ අංශවලින් ඉහළ නිලධාරීන් ඇවිල්ලා ලංකාවේ ඇති වෙච්ච තත්වයට මුහුණ දෙන්න අවශ්‍ය පිඹුරුපත් සකස් කරලා තියෙනවා. ඒක නිසා තමුන්නාන්සේලා බයවෙලා Face book වලට කට කතා දාන්න එපා. ගමේ කටකතා යවන්න එපා. ඒ වගේම මේ වන විට නීතිය ත්‍රිවිධ හමුදාව හා පොලිසියට බලතල පවරලා තියෙන අවස්ථාවේ තමුන්නාන්සේලා ෆේස්බුක් එකේ මේ වගේ ප්‍රචාරණයන් දාන්න ගිහිල්ලා අසවල් මන්ත්‍රීවරයා අත්අඩංගුවට අරගෙන කියලා දැනගන්න ඉඩ තියන්න එපා. මම මේ සියලුම මන්ත්‍රීවරුන්ව ඒ සම්බන්ධව දැනුවත් කරනවා. ඒ වගේම මේ රට විනාශ කරන්න විවිධ දේශපාලන බලලෝභීන් පහුගිය කාලේ බලෙන් උන්මත්තක වෙච්ච අවස්ථා තියෙනවා. ඒ අය බලන් ඉන්නේ මේකෙන් ඒගොල්ලන්ට ගොඩ එන්න. නමුත් එසේ වෙන්නෙ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා බොරුවට සිහින මවන්න එපා. අනික සියලුම මුස්ලිම් මිනිසුන් ත්‍රස්තවාදියන් නෙවෙයි. මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ හැම ජාතියකම මිනිස්සු ජීවත් වෙන්න ඕන. හැබැයි මේක වෙනස් කරන්න යම් දේශපාලන මතිමතාන්තර දරන සුළු පිරිසක් උත්සාහ ගන්නවා. හැබැයි ඒ අයට ඒ මාර්ගයේ තවදුරටත් ගියොතින් ඉදිරියේදී දැඩි අවදානමකට ලක් වෙන්න වෙයි කියලා මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. ඒ වගේම අපේ ප්‍රදේශවල ආරක්ෂාව පැත්තෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. මේ ජනතාව අතර තියෙන බොරු මනස්ගාත තමයි කියන්නේ අපේ ළමයි ඉස්කෝලේ ගිහිල්ලා තියෙන්නේ. තමුන්නාන්සේලා තමයි ඒවට බය. මේ සතිය ඉවර වෙනකොට ඇත්ත තත්වය තේරෙයි ඒ අනුව ජනතාවත් පිළිතුරු දෙයි. ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණ පතමින් මා නිහඬ වෙනවා

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ලේකම්තුමිය, අපේ ශාන්ත මහතා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අපේ පසුගිය සභාවට පස්සේ අපට අලුත් අවුරුද්ද උදාවෙලා, අපි දෙපැත්තෙම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සම්බන්ධ වෙලා සාර්ථකව අවුරුදු උත්සව පවත්වලා සුභදව ගමනක් යද්දී තමයි පසුගිය විසි එක් වෙනිදා මේ සිද්ධිය සිද්ධ වුනේ. ඊට පෙරාතුව අපි ඉතාමත් සතුටින් අලුත් අවුරුද්ද සැමරුවා. විසි එක් වෙනිදා සිදුවුන කනගාටුදායක සිද්ධියේදී ජීවිත අහිමිවුණ විශේෂයෙන්ම රණවිරුවන් තිදෙනා ඇතුළු සියලුම ශ්‍රී ලංකාවාසී ජනතාවට මම පින් පෙත් අනුමෝදන් කරනවා. ඒ වගේම ඒ පවුල් වල අයට ශෝකය ප්‍රකාශ කරන ගමන්ම, රෝගාතුර ව රෝහල් ගත වෙලා ඉන්න සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වගේම අපේ වසන්ත කුමාරගේ මහතා වෙසක් උත්සවය පිළිබඳ සිහිපත් කිරීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. මොකද මං හිතුවා ඔක්කොටම අමතක වෙලා යයි කියලා. ඒ නිසයි මම කතා කරන්න අදහස් කළේ. ඇත්තටම අපට තියෙන උතුම්ම උත්සවය තමයි වෙසක් උත්සවය. ඉතින් මේ වෙසක් උත්සවය සමරන්න පැකිළිලා, රටේ තියෙන ප්‍රශ්න මූලික කරගෙන ඒවා ඉස්සරහට

දාගෙන මේ වෙසක් උත්සවය පස්සට දාන්න එපා කියන එක සියලු මන්ත්‍රීවරුන්ට සිහිපත් කරනවා. දැන් අපි ගමක් ගත්තම අද පාසලට දරුවන් යවන්නෙ නැති වගේම පන්සලට එන්න බය වෙච්ච දෙමව්පියෝ පිරිසක් ඉන්නවා. අපේ ගමේ නම් මම ඒ පිළිබඳ දැනුවත් කළා. අපේ කොට්ඨාශයේ සියළුම අම්මල තාත්තල දරුවන්ට ඇවිල්ලා සිල් ගන්න. ඒ ආරක්ෂාව වගකීම අපේ ගමේ තරුණ පිරිස් බාර ගන්නවා කියන එක සිහිපත් කරලා ගමේ ප්‍රචාරයක් යවලා, ප්‍රධාන රැස්වීම් වල කියලා, මම ගම දැනුවත් කළා. මොකද පන්සල පාළුවට ගියොත් තමයි ඒ අයගෙ කාරණා ඉෂ්ට වෙන්නේ. මොකද මාධ්‍යයෙන් කියනවා බෞද්ධයන්ට අත්වූ ඉරණම, ඒ වගේම පන්සල් වල පාළු ස්වභාවය මාධ්‍ය මගින් හෙළි කරනවා. ඒ නිසා ගමේ පන්සලට ජනතාව ඒකරාශි කර සිල් සමාදන් කරවන්න. ඒ ආගමික වැඩ කටයුතු වලට දායකත්වය ලබා දෙන්න. ඒ වගේම වසන්ත මන්ත්‍රීතුමා සිහිපත් කලා වගේම පාරවල් ගානේ සැරසිලි කරන්න තියෙනවනම් හොඳයි. නමුත් අවසර නැහැ. මොකද රටේ නීතියට අපි අවනත වෙන්න ඕන. ඒ නීතිය ගේන්නේ අපේ ආරක්ෂාවට. ඒ නිසා හන්දි ගානේ කෙසේ වෙතත්, තමන්ගේ කොට්ඨාශයේ නිවෙස් තුළ මේ කටයුතු කරන්න මූලිකත්වය ලබා දෙන්න. ඒ වගේම දැනුවත් කරන්න. දිරිමත් කරන්න. කියන කාරුණික සිහිපත් කිරීම සිදු කරනවා. මොකද ඒව තුළින් අපේ දරුවෝ යම්කිසි පීඩනයට ලක් වෙලා ඉන්න මේ අවස්ථාවේ එය මේ දවස් දෙකට හරි මග හැරිල යන්න ඔවුන්ට උදව් වෙනවා.

ඒ වගේම මම සිහිපත් කරන්න ඕන. මම දැක්කා අන්තර්ජාලයේ තියෙනවා. මේ මේ ආයතන වලින් බඩු ගන්න එපාය කියලා. එහෙම වුනොත් අපට අද ගන්න දෙයක් ඉතුරු වෙලා නැහැ. දත් මදින ක්ලෝගාඩ් එකේ ඉඳලා හැම සම්පතක්ම ගන්න වෙලා තියෙන්නෙ ඒ මිනිස්සුන්ට අවනත වෙලා. ඉතින් එහෙම තත්ත්වයට පත්වෙලා තියෙද්දී අද තමයි සියලු දෙනාට ඇහැ ඇරිලා තියෙන්නෙ. ඉතින් ඒ ගැන මම කනගාටු වෙනවා. නමුත් මේ වෙසක් පොහොය නිමිත්තෙන් මම ඉතාමත් කරුණාවෙන් අපේ ගමෙන් ඉල්ලා සිටියා, දැන් ඔබතුමන්ලාට සිහිපත් කරන්නෙ, දැනුවත් කරන්නෙ කොළඹ පිටකොටුවෙ අද බල්බ් වැල්, ලොරි ගණන් ගොඩගහලා තියෙනවා. ඒ සියලු ව්‍යාපාර කටයුතු කරන්නේ මුස්ලිම් ජනතාව. මුස්ලිම් ජනතාව රිදවීමක් නොවෙයි මෙතනදි කරන්නෙ. නමුත් අද වන විට බෞද්ධ භික්ෂූන් වහන්සේලා පාවිච්චි කරන පාත්තර ඔවුන් ගාවින් හමු වෙනවා. ඒ වගේම අටපිරිකර හදන්නේ මුස්ලිම් ජනතාව. අපේ පන්සල්වල හාමුදුරුවරු අටපිරිකර දෙන්නෙ මුස්ලිම් ජනතාවට. මොකද ඒ මුස්ලිම් ජනතාව තමයි වැඩි මුදලක් දෙන්නෙ. අපි ගිහිල්ලා ඉල්ලුවම අපට වැඩිය අර නානා එනකම් බලන් ඉන්නවා. එහෙම කරන හාමුදුරුවරු සමහරක් වෙලාවට මේ දේවල් විකෘති කරනවා. මම අපේ ගමේ අය දිරිමත් කරන්න දාපු post එකකට එක හාමුදුරු කෙනෙක් මට දොස් කියලා දාලා තිබුණා. මම ඒ හාමුදුරුවන්ගෙ නම කියන්න අවශ්‍ය නැහැ. නමුත් එහෙම හාමුදුරුවරුත් ඉන්නවා. ඒ නිසා ගමේ පන්සලෙන් අටපිරිකර ගන්න අපේ ජනතාව යොමු කරන්න. ඒ වගේම වෙසක් සැරසිලි ආදී සියලූ දේවල් වලදී, ගමේ පැරැණි දේ සිහිපත් කරලා ඒ විදියට කරන්න දැනුවත් කරන්න කියන කාරණය සිහිපත් කිරීම සිදු කරනවා.

ඒ වගේම මම මේ වෙලාවේ සියලු දෙනාටම සිහිපත් කරනවා පසුගිය වසර වල ආපු ගංවතුර ව්‍යසන තත්ත්වය මේ වසරෙත් නො එන්න බැරි නැහැ. අපි පහුගිය දවස්වල ඒ සම්බන්ධව දැනුවත් කිරීමක් කළා. සමහර විට නැවත අපි සභාව පවත්වන විට අපේ ප්‍රදේශය ගංවතුරකින් විනාශ වෙලා තියෙන්නත් පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න ඕන. ඒ නිසා එහෙම තත්වයක් ඇතිවුණොත් කටයුතු කරන්න ඕන කොහොමද කියලා සාකච්ඡා කරලා, අපි එහෙම ස්ථානගත වෙන්නේ කොහොමද, මොකක්ද කරන්නේ කියන එක ගරු සභාපතිතුමාගේ මූලාසන කතාවේ දී සිහිපත් කලොත් හොඳයි කියලා හිතෙනවා. මොකද ඉදිරියේදී එහෙම දෙයක් වෙයි කියන බලාපොරොත්තුව අපට තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, තොටුපළවල් සංවර්ධනය කරනවා කියලා තියෙනවා. සභාපතිතුමා හොඳට දන්න අපේ වනමල් මන්ත්‍රීතුමත් දන්න ගොඩැල්ලවත්ත කියන ප්‍රදේශයේ තියෙන තොටුපල ගැන මහතුන් මහත්මයා නිතර ඉල්ලීම් කරනවා. මොකද එතන තොටුපල පාවිච්චි කරන පිරිස වැඩියි. එතුමා කියන විදිහට රුපියල් විසිදාහක් වගේ මුදලක් තිබුනොත් එය සංවර්ධනය කර ගන්න පුළුවන් කියන එකත්, ඒ පිළිබඳවත් කාරුණික අවධානය යොමු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ජේසිබී යන්ත්‍රය සහ තවත් ට්‍රේලර් රථ දෙකක් වෙන්දේසි කරනවා කියලා ටෙන්ඩර් කැඳෙව්වා. නමුත් ඒ වෙන්දේසිය සිදු වුනේ නැහැ. දැන් මාස හයකට වැඩියි. ටෙන්ඩර් කරුවන්ට ඒ මුදල නැවත ලබා දීලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමා පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

ඒ වගේම දැන් රටේ තත්වය ගැන කතා කිරීමේදී, අපේ වසන්ත මන්ත්‍රීතුමා කිව්වා මේක අවුරුදු තිහකට ඉස්සෙල්ලා තිබුණා කියලා. මම දකුණෙන් උතුරට ගිහිල්ලා උතුරේ යුද්ධ කරලා, ඒ දැකපු අත්දැකීම් තුළ මම දන්නවා. හැබැයි ඔබට අමතක වෙන්න ඇති ඔබට නෙවෙයි දකුණටම අමතක වෙන්න ඇති. දකුණෙ කවදාවත් මෙහෙම පාසල් වැහිලා තිබුණෙ නැහැ. අපි ඒක ඔබතුමාගේ පක්ෂයට බරකරනවාවත්, අපේ පක්ෂයට හොඳ කියනවාවත් නෙවෙයි. මේක සියලු දෙනාගේ වැරැද්දකින්, අපේ සිංහල ජාතියෙ වරදකින් සිද්ධ වෙච්ච සිද්දියක්. මේ සිද්ධිය තුල අපි කාටවත් මේව පටවනවා නෙවෙයි. වරදක් තිබුණනම් නිහඬවෙලා හරි ඉන්න ඕන. මම එය කාරුණිකව සිහිපත් කරන්නේ. මොකද වැරැද්ද හංගාගෙන කතා කරන්න එපා. එහෙම වුනාම ඇත්තටම සෝචනීයයි. මම දන්නකාලෙ ඉඳල 89 ත් ප්‍රශ්න තිබුණා.ඒත් මේ වගේ ඉස්කෝලේ වැහිලා තිබුණෙ නැහැ. ඒ වගේම එදා හිටපු සතුරො නෙවෙයි අද ඉන්නේ. මොකද එදා හිටපු සතුරට යම්කිසි ඉලක්කයක් තිබුණා. නමුත් අද සතුරගේ පරමාර්ථය හොයාගෙන යන්න වෙලා තියෙන්නේ. මරාගෙන මැරෙන කෙනෙකුට ආයුධය මොකද්ද කියන එක නෙවෙයි. ඔහුට ටී56ත් එකයි. කඩුවත් එකයි. ඔහුගෙ ඉදිරිපත් වීම ඉතා භයානකයි. ඒ නිසා අපි මේක විහිළුවට කතාබහ කරන්න හොඳ නැහැ. අපේ ගම්වල අපේ දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව අපි සියලු දෙනාම අවධානයෙන් ඉන්න කියන සිහිපත් කිරීම කරමින්, මගේ කතාවට සවන්දුන් ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි සමස්ත සභාවෙන් අවසරයි. මම නම් දීර්ඝ වශයෙන් ඔය යුද්දෙට පැටලෙන්න සූදානම් වෙන්නේ නැහැ. ඇත්තටම අපේ පලවෙනි වැඬේ වෙන්න ඕන අපේ ජාතියත් ආගමත් නෙවෙයි. පසුගිය විසි එක් වෙනිදා මිලෙච්ඡ ප්‍රහාරය තුළින් අපේම සිංහල ජන කොටසක් විනාශ වුණා. අපි මෙතැන මේක දේශපාලනික වශයෙන් තර්ක විතර්ක ඉදිරිපත් කලත්, අම්මෙක් නැතිවෙච්ච දරුවාට, දරුවෙක් නැති වෙච්ච අම්මට, සහෝදර සිය පවුලක් විනාශ වුන උදවියට මොන තරම් වේදනාවක් ඇත්ද. ඒක නිසා මම මේ යුද්ධෙ ගැන අර පැත්ත බැර කරන්නෙවත්, මේ පැත්තට බැර කරන්නෙවත් නැහැ. මේ වේදනාවට මුහුණ දීපු පවුල් සිය දහස් ගණනක් ඉන්නවා. එහෙම නම් මේක කවුරු කළත් මොකා කලත්, මේක ඉතාම නින්දිත, නිහීන පාදඩ වැඩක් කියලා කියන්න පුළුවන්. ඒක නිසා මේ වෙලාවෙ අපි එහේට ඇඟිල්ල දික් කරන්න පුළුවන්. මහින්ද මහත්තයට ඇඟිල්ල දික් කරන්න පුළුවන්. රනිල් මහත්තයට, සිරිසේන මහත්මයට ඇගිල්ල දික් කරන්න පුළුවන්. එහෙමනම්, මේ හැම එක්කෙනෙක්ම මේ පිටිපස්සේ ඉන්න ඕන. නමුත් මේ මොහොත වෙනකොට නෙවෙයි රටේ ආරක්ෂාව නැතිවුනේ. ඔක්තෝම්බර් මාසයේ 26 වෙනිදා මේ රටේ මහා මංකොල්ලයක් සිද්ධ වුණා. ආණ්ඩු පෙරලියක්. මම මේ පිළිබඳව කතා කරනවා නෙවෙයි. ඒ වගේම මේ රටේ පාසල් වහලා. අපේ සමාජය බාරගන්න ඉන්න ඉදිරි පරම්පරාව නූගත් පිරිසක් වුනොත්, එකේ පාඩුව එන්නේ අපට. ඒ නිසා

අපි ඒ ගැන දැනගෙන තමයි ක්‍රියා කරන්න ඕන. ඒ මොනව වුනත් අද කට කතා ඉතා සරුවට වැවෙනවා. ඒ නිසා තමයි ගොඩක් දේවල් සිද්ධ වෙන්නේ. ඒ ප්‍රහාරය සිද්ධ වුණා. මම එතනදී පිරිසිදු වෙන්න යන්නෙ නැහැ. ඒ වෙලාවෙ ඇත්තටම ආරක්ෂාව මදි. ආරක්ෂක අමාත්‍යවරයා හැටියට මේකට වගකිව යුතු පුද්ගලයෙක් හිටියා නම්, එතුමා ඇත්තටම පැය විසි හතරක් යන්න ඉස්සර වෙලා ඉල්ලලා අස් වෙන්න ඕන. ඒක තමයි උත්තරේ. අපි සුදු හුණු ගාන්න යන්නේ නැහැ. බුද්ධි අංශ තොරතුරු දීලා තියෙද්දි අපේ රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට එතුමාගෙනුත් වැරැද්දක් සිද්ධ වුණා. එතුමා ආරක්ෂක කමිටුවට කැඳෙව්වේ නැහැ. එහෙම වෙන කොට එක්කො ජනතාව දැනුවත් වෙලා තියෙන්න ඕන. නැත්නම් පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕන. එහෙම ඒ දේ සිද්ධ වෙලා තිබුණානම්, අද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්තයට ඇඟිල්ල දික්වෙන්නේ නැහැ. එතනදී අඩු පාඩුවක් වුණා. මේක තමයි සත්‍ය සිද්ධිය. මේ සියල්ලටම මුල වුනේ ආන්ඩුවේ නොගැලපීම. හරියට පොරොන්දම් ගැලපෙන්නේ නැති විවාහයක් සිදු වුණා වගේ දෙයක්. ඒ වගේම ගෙදර ආරවුලක් තියෙන වෙලාවේ දරුවෝ ටික තනිකරලා අප්පච්චි පිටමන් වෙලා ඉන්නවා වගේ දෙයක් දැන් රටේ සිදු වෙලා තියෙනවා. මොකද අප්පච්චි යන්න ඕන වෙලාවක නෙමෙයි. ගිහින් තියෙන්නෙ. ජනතාව මන්ද බුද්ධිකයො නෙවෙයි. අපි යමක් හිතන්න ඉඩ තියෙනවා. ඒක තමයි ඇත්ත උත්තරේ. ඒ වගේම පැහැදිලිවම දැන් පාසල් විවෘත කරන්න පුළුවන්. අද ත්‍රිවිධ හමුදාවත්, පොලිසියටත් අපේ ගෞරවය පුද කරන්න ඕන. පැය විසි හතරක් යන්න කලින් ත්‍රස්තවාදී කල්ලියෙන් 90% ක්ම අත්අඩංගුවට අරගෙන ඉවර කලා. අපි සියලුම දෙනා ත්‍රිවිධ හමුදාවට, පොලිසියට ණයගැතියි. ඒ වගේම ඉස්සරත් පාසල් මුර කරපු කාලයක් තිබුණා. අපි දෙමව්පියන් හැටියට මීට වැඩිය කැපවීමක් අපේ තියෙන්න ඕන. උන්ට පුළුවන් වුනානං බඩේ බෝම්බ බැඳන් එන්න. අපි සිංහල ජාතියට, බෞද්ධයෝ හැටියට යම් කැපකිරීමක් කරන්න පුළුවන් වෙන්න ඕන. පාසලට එන්න හදනකොට කියනවා 13 බෝම්බයක් කියලා. ඒ වගේ කටකතා යනවා. යථා තත්ත්වයට එන්න හදනකොට මේ දේශපාලඥයෝ වැඩේ හරියන්නෙ නැහැ කියලා ඒ කටයුත්තට අකුල් හෙලනවා. මෙයාල සංවර්ධන වැඩ කරාවි, රැකියා ලබාදීම් කරාවි, කියලා බයේ මොනාහරි කටකතාවක් යවනවා. ඒක තමයි දේශපාලනය කරනවා කියන්නේ. මහින්ද රාජපක්ෂ මහත්තයා වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, මේ කවුරු කළත් මෙන්න මේක තමයි අද සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා අපි බොහොම බුද්ධිමත්ව කටයුතු කරන්න ඕන. නාගොඩ ප්‍රාදේශීය සභාවට, ගාල්ල දිස්ත්‍රික්කයට එච්චර ගානක් නැහැ. මියගිය මළවුන් අතර ඉන්න අහිංසක දෙමව්පියෝ දරුවෝ අද වද විඳිනවා. තවත් දෙයක් තමයි. මහින්ද රාජපක්ෂ මහත්තයා හොඳින් ගන්න බැලුවා, නරකින් ගන්න බැලුවා, එකකින්වත් හරි ගියේ නැහැ. දැන් කට කතාව තුළින් රට අරාජික කරලා මොන ක්‍රමයකට හරි එන්න බලනවා. ඒ නිසා අපි බලමු වෙන්නේ මොකක්ද කියලා.

ඒ වගේම එළඹෙන වෙසක් පෝය අපි බෞද්ධයන් හැටියට හැමෝටම පන්සල් යන්න කියලා මම ආරාධනා කරනවා. අපි පන්සල් නොගිහින් හිටියොත් තමයි ඒ අය විජයග්‍රහණය කරන්නෙ. ඒ වගේම වෙසක් උත්සවයට සල්ලි අපි කොහෙන් හරි ගෙනැල්ලා දෙනවා. එනිසා අපිට ශක්තිමත්ව මුහුණ දීමේ හැකියාවක් තියෙනවා. ඒ වගේම කාදිනල් පියතුමා රටේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. එතුමාට අපි ගෞරව කරන්න ඕන. එතුමාගේ ප්‍රකාශයත් එක්ක අද අපි ආඩම්බර වෙන්න ඕන. ඇත්තටම ඉතා සංවරව, නිහතමානීව තමයි ඒ වචන ටික කියලා, කිසි කෙනෙක් මේකට ප්‍රකෝප වෙන්න එපා කියලා කිව්වෙ. ඒ නිසා තමයි මිනිස්සු නිහඬ වුණේ. ඒ වගේම මිනිස්සු ඝාතනය වෙලා හත් දවසේ බණ කියලා දානෙ දීලා මිනිස්සු වේදනාව යටපත් කරගෙන යනකොට, එකෙක් දෙන්නෙක් කඩයකට දෙකකට ගහනවා. මේ දේවල් සිදු කරන්නේ ව්‍යසනයට පත් වෙච්ච පවුල් වලින් නෙවෙයි. දේශපාලන නායකත්වය තුළින් තමයි සියළු දේවල් කරන්නේ. නමුත් තමුන්නාන්සේලාගේ දේශපාලන ගමන යන්න බැරි වෙනවා.

ඒ වගේම ප්‍රදේශයේ මේ වෙනකොට නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට සභාපතිතුමාට සහ අපි සියලු දෙනාටම සතුටු වෙන්න පුළුවන්. අද හැම පැත්තෙන්ම සංවර්ධන කටයුතු සිදු වෙනවා. උප සභාපතිතුමා කිව්වා වගේ මම ඒකට එකඟ වෙනවා. හැබැයි ඉස්සර මෙහෙ පාරක් සංවර්ධනය කරනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, අනුමත කරල එවන්න ලයිස්තුවක් සභාවට එවනවා. මම කියන්නේ මොන සභාපතිතුමා මොන පැත්තෙ වුණත්, මොන ගමන ගියත්, අපි එකටයි යන්නේ, පාරකට හරි වෙනත් දෙයකට හරි ඒ වැඩේ කරන්න ඉස්සරවෙලා අනුමැතියට මෙතෙන්ට එන්න ඕන. ඊට පස්සේ තමයි ගිහිල්ලා ඇස්තමේන්තු හදලා, මුදල් වෙන් කරන්නේ. ඒ වන තෙක් මුදල් වැය කිරීමේ හැකියාවක් නැහැ. නමුත් අද ඊට එහා ගමනක් ගිහිල්ලා තියෙනවා. ඒක නිසා මේක නිවැරදි කරගන්න. මේක කියන්නේ අද දවස ගැන හිතලා නෙවෙයි. සභාපතිවරයෙකුට තියෙන ශක්තිය, බලතල එක විනාඩියකටවත් කිසි කෙනෙකුට දෙන්න යන්න එපා. ඒ ශක්තිය තුළින් තමුන්නාන්සේගේ ගමන යන්න. මම හිතනවා කිසිම කෙනෙක් මෙතනදි ඒවට විරුද්ධ වෙන්නේ නැහැ. මාර්ග ටික සංවර්ධනය වෙන එක ගැන අපි අනිත් පැත්තෙන් සතුටු වෙනවා. අවුරුදු විස්සක්, විසිපහක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණා. මේ මොහොත වෙනකොට පාලම් 10,15 ක් සංවර්ධන වෙනවා. ඒකට අපි සතුටු වෙන්න ඕන. නාගොඩ ප්‍රාදේශීය සභාවට මේක තනියම කරන්න ගියා නම් දරාගන්න බැහැ. අපි ආඩම්බර වෙන්න ඕන. අපේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් පළාත් පාලන අමාත්‍යවරයා පත් වුන නිසා තමයි මේ සංවර්ධන වැඩ කොටස් ටික මේ ආකාරයෙන් සිද්ධ වුණේ. ඒ වෙනුවෙන් අපි එතුමාට අපේ ගෞරවය පුද කරනවා. ඒ වගේම මේ වෙලාවෙ අපි තමුන්නාන්සේලා සියළු දෙනාටම තියෙන වගකීම තමයි ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීම. අපේ එම වගකීම හරියට ඉටු කරමු කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. උප සභාපතිතුමා කිව්වා ගෙවල් වලට යන පාරවල්වලටත් බෝක්කු දාලයි කියලා. හැබැයි ඒක අනුමත වුනේ මේ වකවානුවේදි නෙවෙයි. ඒක පහුගිය කාල සීමාව තුල සිද්ධ වෙච්ච දේවල්. ඒක තවදුරටත් සිදු වෙනවා නම් අපි කියනවා එක වැරදියි කියලා. ඒත් එහෙම වෙලා තියෙනවා. ඒක නිවැරදි විය යුතුයි. අනාගතයේදී භාරගන්න ඉන්න මේ කට්ටියට හරියට වැඩ කටයුතු කරන්න ඕන නිසා වර්තමානයේ හරි දෙයක් කරමු. රටේ ශක්තියත්, අපේ ශක්තියත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක වර්තමාන අග්‍රාමාත්‍යවරයාගේ ශක්තිය තුළින් මේ රට මේ යන්නා වූ ගමන ඉතා සාර්ථකයි. තව ටික දවසක් යනකොට අපි රැකියාවල් දෙනවා. දැනට එක් ගමකට නමුත් සමෘද්ධිය පවුල් 30 -40 කට දෙනකොට තමුන්නාන්සේලට මේවට මුහුණ දෙන්න බැරි වේවි. ගරු සභාපතිතුමනි තමුන්නාන්සේ මේ ගමන යාමේදී මේ පැත්තෙන් නෙවෙයි උපදෙස් ගන්න ඕන. තමුන්නාන්සේට අපි උපදෙස් දෙන්නම්. මොකද හොඳ දේ අපි දැක්කා, හොඳ දේ අපි කරනවා. අපේ රටේ සිංහල බෞද්ධයන් විතරක් නෙවෙයි. අනිත් ජාතින් වර්ගත් ඉන්නවා. මමත් නිර්භයව කියනවා ව්‍යවස්ථාවේ උඩින් ලියල තියෙනවා. සිංහල බෞද්ධ කමට ප්‍රමුඛතාවය දෙන්න කියලා. නමුත් අපේ රට සිංහල, බෞද්ධ, මුස්ලිම්, බර්ගර් සියලු දෙනාටම අයිති රටක්. අපේ රටේ ඉතිහාසය ඒක. අපි නිදහස ලබා ගනිද්දී ඩබ්ලිව් ඩී බණ්ඩාරනායක මැතිතුමා, සේනානායක මැතිතුමා විතරක් නෙවෙයි. වෙනත් මුස්ලිම් ජාතින් ඒ වෙනුවෙන් සටන් කළා. ඒ මේ පොදු රටක් හැටියට හිතලා. තමුන්නාන්සේලා මාව ඉතිහාසයට යවන්න එපා. විකුණාගෙන කෑමේ පළමු ප්‍රතිපත්තිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ආරම්භ වුනා කියලා මම කියනවා. අපි බොහොම වැදගත් විදියට ධර්මසිරි මන්ත්‍රීතුමාගෙ කතාවට සවන් දුන්නා. ඇත්තටම මම එතුමාට ගෞරව කරනවා. එතුමා ඇත්තටම හරි දේ හරි විදියට දැක්කා. වැරදි දේ දැක්කා. බොහොම සංවර විදියට අවශ්‍ය දේ කිව්වා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ දී, තව සතියකින් උදාවෙන වෙසක් පෝය ගැන කටකතා ඒවි. පන්සල් යන්න, දහම් පාසල් යන්න එපයි කියාවි. මේ සියල්ලටම ඇහුම්කන් දෙන්න එපා. සිංහල බෞද්ධයන් හැටියට සියලු දෙනාම වෙහෙර විහාරස්ථානවල ගිහිල්ලා ප්‍රතිපත්ති පූජාවන් ඉටුකරමින් කටයුතු කරන්න. ඊළඟ සභා වාරය එනකොට යුද්දෙ ගැන, බෝම්බ ගැන කතා කරන්න තියන්නේ නැහැ. පාසල් විවෘත වෙලා තියේවි. ඒ සියලු කට කතා අවසන් වෙයි. නැවත සංචාරකයින් මේ රටට පැමිණේවි. සංවර්ධන කටයුතු සිදු වේවි. ඒ වගේම

2025 වසර වෙනකම් මේ ආණ්ඩුව ගමන් කරාවි. එහෙමනම් අපි සියලු දෙනාම අත්වැල් බැඳගෙන මේ ගමන යමුයි කියලා ප්‍රකාශ කරමින්, තමුන්නාන්සේලට ජයවේවා කියා පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මට පුද්ගලික ඉල්ලීමක් කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මම දැනුවත්ව මුස්ලිම් පදිංචියක් නැහැ. එහෙම පදිංචියක් තියෙනවා නම් සමාවෙන්න. මම ඒ ගැන දැනුවත් නැහැ. ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් මම ඉල්ලීමක් කරනවා. එහෙම මුස්ලිම් සම්බන්ධයක් තියෙනවා නම්, බුර්කාව කියන එක පාවිච්චි කරනවා නම්, නාගොඩ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශවලට ඇතුල් වීමේදී, බුර්කාව කියන එක තහනම් කරන්න. දැන් බුර්කාව තහනම් කරලා තියෙන්නේ. ඒ නීති රීති ක්‍රියාත්මක කරන්න අපෙනුත් යම්කිසි මැදිහත්වීමක් සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මගේ තව ඉල්ලීමක් පුද්ගලිකවම සියළු දෙනාගෙන්ම ඉල්ලන්නෙ. මින් ඉදිරියට නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මුස්ලිම් පදිංචියක් සිදු වෙනවා නම්, ඒ සම්බන්ධව අපට ක්‍රියාමාර්ගයක් ගන්න පුලුවන්ද කියලා මම දැනුවත් වෙන්න කැමැතියි. එහෙම සිදුවෙනවා නම්, ඒ සඳහා ඉඩ නොතබන ලෙස මම ඉල්ලා සිටිනවා. මොකද මින් ඉදිරියට එහෙම දෙයක් සිදුවුණොත් යම්කිසි ජන කැළඹීමක් ඇති වෙන්න පුළුවන්. ජනතාවගේ විරෝධතාවයක් ඇති වෙන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කර සිටිනවා. මම ප්‍රධාන වශයෙන්ම අද සභාවේ දී කතා කරන්න බලාපොරොත්තු වුනේ එම කාරණා දෙක පිළිබඳ.

ඒ වගේම වෙසක් උත්සවය ගැන කතා කළා. මම මේ වෙලාවේ අපේ ගරු ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමාට විශේෂ අගය කිරීමක් සහ ස්තූති කිරීමක් කරන්න කැමතියි. ඒ මන්ත්‍රීතුමා එතුමාගේ කොට්ඨාශය තුල වෙසක් පොහොය නිමිත්තෙන් හොඳටම සැරසිලි සිදු කරන නිවසට එතුමාගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් රුපියල් 5000.00 ක මුදලක් ලබාදෙන්න කටයුතු කරලා, ඒ පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරලා තියෙනවා. මේ අවස්ථාවෙ හැටියට කාලෝචිතව කරපු ඉතා වටිනා වැඩක්. ඒ පිළිබඳව මම නැවතත් ස්තූතිය පුද කරනවා.

අවසන් වශයෙන් මෙන්න මේ කාරණය මතක් කරනවා. ලංකා ඉතිහාසයේ, දේශපාලන ඉතිහාසයේ ආණ්ඩු ගත්තම, එක්සත් ජාතික පක්ෂය බලයට පත්වන හැම වකවානුවක් ම අවසන් වෙන්නේ මේ ලංකාව මහා විනාශයකට ඇදලා දාලා. ඉතිහාසයේ ඉඳලම දිගටම එහෙමයි. මට මතකයි 2002 වර්ෂයේ සාම ගිවිසුමක් ගෙනැල්ලා මේ රට අන්ත ආගාධයකට ඇදලා දැම්මා. ජේ ආර් ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මේ කොටි ත්‍රස්තවාදයේ මූල බීජ ඇති කරලා, මේ ත්‍රස්තවාදය කියන එක පෝෂණය කරපු එකම පක්ෂය විදියට එක්සත් ජාතික පක්ෂය හඳුන්වන්න පුළුවන්. මම දේශපාලනය ගැන කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඉතාම කණගාටුදායකයි. දැන් ප්‍රහාරය දියත් වෙලා සති තුනක වගේ කාලයක් යනවා. නමුත් කිසිම කළ කෝලාහලයක් ආරවුලක් ඇති වුණේ නැහැ. අකිල විරාජ් කාරියවසම් මැතිතුමා සිටින කුරුනෑගල, ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ආසන සංවිධායකවරු ඉන්න වයඹ පළාතටම මේ වෙද්දිත් ඇදිරි නීතිය පනවලා තියෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල ඇමතිවරු ඉන්න ආසන වලින් තමයි මේ මුස්ලිම් අන්තවාදය පටන් ගන්නේ. දැන් මේ වෙනකොට බෝම්බ පුපුරන එක ගැන, මුස්ලිම් අන්තවාදය ගැන කතා කරන්නේ නැහැ. අද වෙනකොට අපි කතා කරන්නේ මුස්ලිම් මිනිස්සුන්ට ගහන එක ගැන. එතකොට මනස සම්පූර්නයෙන්ම වෙනස් පැත්තකට ගිහිල්ලා තියෙන්නේ. ඒ වගේම ඉදිරි මැතිවරණ කල් දාන්නත් ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ඇමරිකා ගැති වත්මන්

අග්‍රාමාත්‍යවරයා ඇමරිකා කඳවුරක් මෙහි ස්ථාපිත කරන්න කටයුතු කටයුතු සූදානම් කරමින් යනවා. අපේ රටේ ගිනි අවුලලා, ජාතිවාදයක් ඇති කරලා මේ හැම දෙයක්ම විනාශ කරලා, අපේ රට ඇමරිකාවේ ප්‍රාන්තයක් බවට පත් කරන්න කටයුතු කරමින් ඉන්න බවත් මතක් කරනවා. ඒ වගේම මම මෙතන ඉන්න සියලුම දෙනාගෙන් ඉල්ලා සිටින්නේ මේ ජාතිවාදී අරගල සඳහා කිසිම සහායක් වචනයකින් හෝ ලබා නොදෙමු. එහෙම දෙයක් වෙන්න යනවනම් ඒක වලක්වගන්න අපි අපට හැකි උපරිම දේ කරමු. අද වන විට මේ ත්‍රස්තවාදය ගමට ඇවිල්ලා නැහැ කියනවා නම්, ඒක බොරුවක්. අද ගමේ ඉස්කෝලේ, පොළේ ඉදලම අවදානම් තත්වයක් තියෙනවා. මරණාධාර සමිතිය පවත්වන්නත් පොලීසියෙන් අවසර ගන්න ඕන. ඉතින් මේ විදියට සාමාන්‍ය ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාල වෙලා තියෙනවා. 2015 හිටපු ජනාධිපති, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර දෙද්දී තිබුනට අද කොතනද කියලා මේ රටේ මුළු ජනතාවම දන්නවා. ජාතික ආරක්ෂාව තිබුණා. ඒ වගේම ආර්ථික සංවර්ධනය හැම අංශයක්ම ක්‍රියාත්මක වුණා. අද වන විට සිදු කරන සියලු ව්‍යාපෘති එදා මහින්ද රාජපක්ෂ මහත්තයගෙ ආණ්ඩුව කාලෙ කරපු යෝජනා සහ ඇස්තමේන්තු වලින් තමයි කියන එක අවශ්‍යතාවයක් තියෙනව නම්, මම සාධක සහිතව ඉදිරි සභාවක ඔප්පු කරල පෙන්වන්නම්. ඒ වගේම මෙතුමන්ලා ප්‍රකෝප කිරීම් ගැන කතා කළා. මන්ත්‍රීතුමා, ඔබතුමන්ලගේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා රාජ්‍ය අනුග්‍රහය ලබාගෙන ලිපි බෙදද්දී තමයි මාට්ටු වුනේ. ගරු සභාපතිතුමනි, මම මගේ කතාව අවසන් කරන්නම්. ඒ වගේම විපක්ෂයේ මන්ත්‍රීවරු කතා කරන විට ගරු සභාපතිතුමා කිසිම වචනයක් කිව්වේ නැහැ. නමුත් ආණ්ඩුපක්ෂයේ මම සහ අනිත් අය කතා කරන විට ඔබතුමා විරෝධය ප්‍රකාශ කළා. ඒ පිළිබඳ මගේ කනගාටුව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම මගේ කොට්ඨාශයේ ඉල්ලීමක් කරනවා. නාගොඩ ප්‍රාදේශීය සභවේ උඩවැලිවිටිතලාව ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධයෙන්, ගාල්ල අධිකරණයේ පවතින එල් 15888 දන නඩුව සම්බන්ධයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 12 උඩවැලිවිටිය කොට්ඨාසයේ ඉහත මාර්ගය, 2001 වර්ෂයේ එවකට සභාපතිව සිටි නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ යෝජනාවකට අනුව, ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඇතිව, මාර්ගය අලුතින් කපා සංවර්ධනය කළා. උඩවැලිවිටියේ පදිංචි සී කාරියවසම් මහතා විසින් ඔහුගේ ඉඩම දෙකට බෙදී ඇතැයි පවසා, ගාල්ල දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත. මෙම නඩුව මාස තුනකට වරක් කැඳවන අතර, ඒ සඳහා නීතිඥ ගාස්තු වශයෙන් සහ උසාවියේ කටයුතු සඳහා විශාල මුදලක් මගේ පෞද්ගලික මුදලින් මේ දක්වා ගෙවා තිබෙනවා. මෙය ප්‍රාදේශීය සභාව මඟින් පාර කපලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කොන්ක්‍රීට් කර, 194 උඩවැලිවිටිය ග්‍රාම නිලධාරි වසමේ ප්‍රධාන මාර්ගයක් ලෙස දැනට දිනකට දහසක පමණ පොදු ජනතාව ගමන් පහසුව සලසාගන්නා, ගමේ තියෙන ප්‍රධාන මාර්ගයක් ලෙස මේ මාර්ගය හඳුන්වන්න පුළුවන්. මෙම නඩුව පොදු කටයුත්තක් සේ සලකා, නීතිඥ ගාස්තු මෙම සභාවෙන් ගෙවීමට අවසර දෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම නඩුව සඳහා පෙනී සිටින්නේ ප්‍රාදේශීය සභාවේ නඩු වෙනුවෙන් පෙනී සිටින හේමන්ත පී.ඩබ්. විතාරණ මහතා බැවින්ද මේ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරලා, යම් සාධාරණයක් කරන්න කියලා මම අපේ ගරු සභාපතිතුමන් ඇතුළු සමස්ත සභාවෙන්ම මේ වෙලාවෙදි කාරුණිකව ඉල්ලීමක් කරනවා. මොකද මේක මුළු ගමක්ම පරිහරණය කරන පාරක්. අහිංසක මම තනියම උසාවියට මුදල් ගෙවමින් මේ නඩුව සඳහා පෙනී සිටිනවා. ඇත්තටම මම හරිම අපහසුතාවයට පත් වෙලා ඉන්නෙ මේ නඩු කටයුත්ත නිසා. ඒ පිළිබඳව නැවතත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම යමක් කෙටියෙන් හෝ කතා කිරීමට බලාපොරොත්තු වෙනවා. දැන් රටේ තත්ත්වය ගැන කතා කරන විට, මේක කාගේ වැරැද්දක් ද කියලා මම දන්නේ නැහැ. අපි මේ වෙලාවේ සිංහල ජාතියක් විදියට එකට එකතුවෙලා, එකමුතුවෙලා විසඳාගත යුතු ප්‍රශ්නයක් බවට මේ ප්‍රශ්නය පත්වෙලා තියෙනවා. පසුගිය 21 දා ප්‍රහාරය ඉතාම සැලසුම් සහගත විදියට, මේ රජයේ ඉතා සීමිත පිරිසක් මේ කටයුත්ත පිටිපස්සෙ ඉන්නවා. මම හැමෝටම ඇඟිල්ල දික් කරන්නේ නැහැ. ඒකේ පළවෙනිම දේ තමයි බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා විසින් මීට අවුරුද්දකට විතර උඩදී විහාරස්ථාන ලියාපදිංචි කරන්න බැහැ කියලා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට චක්‍රලේඛනයක් එවනවා. ඉස්සර අපිට විහාරස්ථානයක් ලියාපදිංචි කිරීමේ හැකියාව තිබුණා. ලංකාවේ පන්සල් තියෙන්නෙ හත්දහස් තුන්සිය ගානයි. මට ගණන හරියටම මතක නැහැ. හාමුදුරුවරු ඉන්නේ තිස්දාස් ගණනයි. පල්ලි නම දහස් ගණනක් තියෙනවා. මම මේ වගකීමෙන් යුතුව කියන්නේ. මම මේ කාටවත් දොස් කියනවා නෙවෙයි. අපි කවුරුත් මේවා සාකච්ඡා කරලා ප්‍රශ්න විසඳගන්න ඕන. ඊළඟට විහාරස්ථාන ලියාපදිංචි කරන්න බැරි වුනාට, අනිත් අන්‍යාගමික ස්ථාන ඕන එකක් ආරම්භ කිරීමේ හැකියාව තියෙනවා. මේවා ගැන කතා කරන්නෙ නැති නිසා තමයි මේ ප්‍රශ්නේ ඇති වෙලා තියෙන්නේ. ඒ වගේම එම චක්‍රලේඛයේ තියෙනවා. අවට පන්සල්වල අවසරයක් නැතිව අලුත් පන්සලක් ලියාපදිංචි කල නොහැකි බව. මේ සම්බන්ධව තීරණයක් ගන්න ඕන. මේ වෙලාවෙදි අපි කවුරුත් ලංකාවේ සියලුම දේශපාලන අධිකාරිය එකතු වෙලා නීතියක් ගේන්න ඕන. එක පවුලකට ළමයි තුන් දෙනෙක්වත් කියලා සීමා කරන්න ඕන. මොකද අපේ සිංහල ජාතිය හදන්නේ උපරිම ළමයි දෙන්නයි. මේ තියෙන පරිසරයත් එක්ක කොහොමත් ඊට වැඩිය ළමයි හදන්න අමාරුයි. නමුත් මම මේ කියන දේ හැල්ලුවට ලක්කරන්න එපා. මම කියන්නේ සත්‍ය දෙයක්. ඇත්ත වශයෙන්ම මේ නීතිය ලංකාව තුළ නීතිගත කරන්න ඕන. වෙන සමහර රටවල්වල මෙවැනි නීති ගෙනත් තියෙනවා. මම ඒ ගැන වැඩිය කතා කරන්නෙ නැහැ.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපි කොයි කවුරුත් ආණ්ඩු කළත්, මේ සිදුවන හැමදේටම අපි හැමෝම වගකියන්න ඕන. ඒ නිසා මේවා සෙල්ලමට භාජනය කර ගත යුතු කරුණු නෙමෙයි. සිංහල ජාතියක් හැටියට අපි ලැජ්ජ වෙන්න ඕන. ඊළඟ එක තමයි මේ ආණ්ඩු කරන පිරිස, ඉතා සුළු මුස්ලිම් පිරිසකගේ බලාපොරොත්තු ඉටුකිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගන්නවා. පැහැදිලිව අපි ඒක දැක්කා. කැබිනට් ඇමතිවරු මාධ්‍යයෙන් කතා කරනවා. කඩු තියන් ඉන්නෙ තණකොළ කපන්න කියලා. මොන තරම් විලිලැජ්ජ නැති කථාවක්ද? රජයේ ඇමතිවරු විදිහට මීට වැඩිය වගකීමෙන් කතා කරන්න ඕන. අද ඒ ප්‍රශ්නය හැල්ලුවට ලක් වෙලා. ඇතැම් පිරිසක් නිසා මේ දේ සිදු වුණා. මේ සිද්ධීන්වලට ක්‍රියාමාර්ග නොගත්තොත්, තව තවත් ප්‍රශ්ණ ඇතිවෙනවා. මුස්ලිම් අන්ත පිරිසක් අද ඇති වෙනකම් බැට දෙනවා. ඒ පිළිබඳව කිසිකෙනෙක් කථාකරන්නෙ නැහැ. ඒ නිසා මම කියන්නේ මේ රජයට වැරදි තියෙනවනම් ඒවා හංගගන්න හොඳ නැහැ. අනිත් එක තමයි අද ආණ්ඩුව කියන කිසි දෙයක් කවුරුත් පිළිගන්නේ නැහැ. ආණ්ඩුවෙන් කියනවා පාසල් වලට ළමයි එවන්න කියලා. නමුත් අද ගෙවල්වලින් ළමයි පාසලට යවන්නේ නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව කරන්න නම් අන්න ඒ අඩුපාඩු හදා ගනිමින් ඒ කටයුතු කරන්න. ඒ වගේම අද මේ කඩු හම්බ වෙන්නේ පල්ලිවලින්. අපි බලන්න ඕන පල්ලිවල කඩු තියෙන්නේ මොකටද? ඒ ගැන සැලකිලිමත් වෙලා කටයුතු කරන්න ඕන. ඊළඟට ද කුරුණෑගල ප්‍රදේශයට ඇඳිරි නීතිය දාලා.

ඒ වගේම මාධ්‍ය හසුරුවන ක්‍රමවේදය වැරදියි. තොරතුරු දැනගන්න විදියක් නැහැ. තොරතුරු දැනගැනීමේ පනත අනුව කවුරුහරි උසාවිය නඩුවක් දැම්මොත් මේ ක්‍රමය වැරදියි. ඒ නිසා ඇත්තට මේ වෙලාවේ අවනීතිය රජ වෙලා තියෙන්නෙ. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහත්මයා කිව්වා වගේ, මේ ගෙදර දැන් මේ විවාහය කරන්න බැහැ. හොඳම දේ තමයි ඉතාම ඉක්මනින් මැතිවරණයක් කැඳවීම. එවිට ඕන කෙනෙකුට බලය අරගෙන කරන්න පුලුවන් විදිහේ වැඩපිළිවෙළක් හදාගන්න පුළුවන්.

අපේ රටේ අනාගතය පිළිබඳ තීරණයකට තමයි ඒ පහර හෙලන්නෙ. අද වන විට සිදුවන සිදුවීම් වලින් අද අපි දුක් විඳිනවා. හෙට අනිද්දා වෙනකොට, මේ විදිහට ගියොත් ජීවත් වෙන්නවත් හම්බ වෙන්නේ නැහැ. මොකද අපි ආර්ථිකමය වශයෙන් ඉතාමත් පහලට වැටිලා තියෙන්නෙ. මේ හැම තැනින්ම ප්‍රශ්න ඇති වෙච්ච වෙලාවේ මේ තෙල් සූත්‍රය ක්‍රියාත්මක නොකළ යුතු දෙයක්. එමෙන්ම මංගල සමරවීර මහතා අපේ සිංහල ජාතියට කළේ නිගාවක්. එම ප්‍රකාශයත් එක්ක තමයි කෝප වෙන්න පටන් ගත්තේ. සමහර පිරිස් හිතනවා. මේක මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු පිරිසක් විසින් නිර්මාණය කරලා, ඒ අයට වාසියක් ගන්න සිදු කළා කියලා. නමුත් එහෙම නෑ. මේ කැබිනට් ඇමතිවරුන්ගේ ප්‍රකාශ සමග සුළු ජාතික මුස්ලිම් ප්‍රජාව කරන ප්‍රකාශ සමඟ මේ ආණ්ඩුව ප්‍රබල ස්ථානයක තිබිලා නැවත වලට වැටෙනවා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ඉන්න එක හොඳයි. ඔබතුමාල මතක තියාගන්න. එදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති හැටියට පත් කලහම, ඔබතුමන්ලගේ නායකතුමා විජිත හේරත් මහත්මයා පුදුම නැටිල්ලක් නැටුවේ. ඒ වගේම 1989 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රටේ පහළ වෙච්ච විශිෂ්ටම දේශපාලන නායිකාව. එතුමියට මේ රටේ ජනාධිපති වෙන්න බැරි කළේ ජනතා විමුක්ති පෙරමුණ. මේ රට කාබාසිනියා කළේ ජනතා විමුක්ති පෙරමුණ කියන එක මම කියනවා. මේ පහුගිය වකවානුවේ සිදු වෙච්ච දේවල් වලට සම්පූර්ණයෙන් වග කියන්න ඕන ඔබතුමාලා. දැන් නිකන් බොරුවට කොළ බෙදලා, කණගාටුව ප්‍රකාශ කළාට හරියන්නේ නැහැ. ඒ වගේම තවත් කාරණයක් තමයි. මම කනගාටු වෙනවා මේ රටේ සේනාධිනායකයා විධායක ජනාධිපතිතුමා අද රට ගිහිල්ලා. ජනාධිපතිතුමාට මේ පිළිබඳව අවබෝධ කරල දෙන්න අගමැති ප්‍රමුඛ කැබිනට් ඇමතිවරුන්ට පුලුවන්කම තියෙනවා. මොකද මේක එක රජයක්. එකට ඡන්දය දීලා මේ ආණ්ඩුව හැදුවේ. ඊළඟට මහින්ද රාජපක්ෂ මහත්තයා යුද්ධයක් කළා. ඒ යුද්දෙ කාලෙ කිව්වෙ අපි කිඹුල් කඳුළු හෙළනවා යි කියලා. පාමංකඩ කතා , කිලිනොච්චි කතා වගේ විශාල ප්‍රකාශ ගොඩක් සිදුකළා. ඒ වගේ එක එක්කෙනාට ඇඟිල්ල දික් කර ගැනීමේදී, මම නැවතත් සඳහන් කරන්නේ මීට වැඩිය ශක්තිමත්ව රජය මේකට මුහුණ දෙන්න ඕන. අද මේ ආණ්ඩුවට පුළුවන් හදිසි නීතිය දාලා ඒ බලතල පාවිච්චි කරන්න. නමුත් ඒවා සිදුවෙන්නේ නැහැ. නමුත් අද මේ අය සංචාරකයෝ ගෙන්වන එක, ආර්ථිකය ගොඩ ගන්න එක ගැන කතා කරනවා. නමුත් ඩීඑන්ඒ පරීක්ෂණ වාර්තා අරගත්තේ නැති, රස පරීක්ෂක වාර්තා ගත්තෙ නැති මල මිණී දෙසීයකට  වැඩි ප්‍රමාණයක් ගොඩගැහිලා තියෙනවා. ඒ අදාල මිනිස්සුන්ට මරණ සහතික නිකුත් කරළා මරණ ලබාදෙන්න කටයුතු කරලා නැහැ.  කොළඹ මෝචරිවල, ඉස්පිරිතාලවල මිනී ගොඩ ගැහිලා තියෙන්නේ. රජයක් විදියට මේ දේවල් ඉස්සෙල්ලා කරන්න. මාධ්‍ය වාරණ දැම්මෙත් නිකන් නෙවෙයි. මේ සියලු දේවල් වහගන්න. ඒ වගේම මේ රටට අහිතකර විදිහට විදේශ බලපෑමක් ගොඩනැගෙන්න ඉඩ දුන්නා. ඇමරිකා බුද්ධි අංශය ලංකාව තුළට රිංග ගෙන තියෙන්නෙ. කොයි කවුරු කිව්වත් එල්ටීටීඊ සංවිධානය කඳවුරු බැඳගෙන මහා විනාශයක් කරන්න ලෑස්ති වුණා. නමුත් මේකෙ දගලන්නෙ හතර පස් දෙනෙක් විතරයි. ඒ නිසා මෙහිදී ඒවට නිසියාකාරයෙන් ශක්තිමත්ව මේ රජය මුහුණ දෙන්න ඕන. අද ආණ්ඩුවක් නැති තත්වයට පත්වෙලා තියෙන්නෙ. මේ විදිහට ගියොත් අපට රටක් නැති වෙනවා. ඒ නිසා මම කරන පළවෙනිම යෝජනාව තමයි ඉක්මනින්ම රජයේ අවශ්‍යතාවයන් ඉටු කරන්න. මෙතුමා කිව්ව වගේ දැන් අලුත් රස්සාවල් ලැබිලා තියෙනවා. පාසල් වල මුර කරන්න. ඒක හැමදාම කරන්න බැහැ.

ඒවගේම සිංහල සාහිත්‍යයේ තියෙන ගම්පෙරළිය කියන උත්තම නම දැන් පොඩි ළමයි හෙට අනිද්දා වෙනකොට හැල්ලුවට ලක් කරනවා. ඒක අසාර්ථක ව්‍යාපෘතියක්. ඒක බලන්න අපි කැමති නැහැ කියාවි. යුගාන්තය ඉවරයි. දැන් කලියුගය ඇවිල්ලා තියෙන්නේ. ඉතින් මම එදා කිව්වා මේ වගේ දේවල් වෙනවා කියලා. එනිසා මේවා හැල්ලුවට ලක් කරන්න එපා. ඇත්ත වශයෙන්ම මම කොයි වෙලාවකවත් කාටවත් අගෞරව කරන්නේ නැහැ. මේ රජයන් වල තියෙන අඩුපාඩුකම් විතරයි මම පෙන්නල දුන්නෙ. මම කැමති නැහැ කිසි කෙනෙකුට ඇඟිල්ල දික් කරලා චෝදනා කරන්න. නමුත්

මම මේ කියපු දේවල් සර්ව සාධාරණයි. හැබැයි මේ මුස්ලිම් ඇමැතිවරුන්ට මේ රජය විසින් යම් දෙයක් නොකර බලාගෙන හිටියොත්, මේ ඉන්න සියළුම සිංහල ඡන්ද ටිකට පහර වදිනවා කියන එකත් සිහිපත් කරමින්, ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්න තියෙන්නේ. මගේ පළවෙනිම මගේ කොට්ඨාශයේ ඉල්ලීම පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඉනෝකා මන්ත්‍රීතුමියත් ඒ ගැන කතා කරයි. එතුමිය හැමදාම යන්නේ ඔය පාරේ. මේ යෝජනාව හරි එතුමිය ස්ථිර කරන්න කටයුතු කරන්නට කියලා මම ඉල්ලා සිටිනවා. එමෙන්ම මේ අවස්ථාව ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමාට ගෞරවය සහ ප්‍රණාමය පුද කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්.පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පළමුවෙන්ම මම සභාපතිතුමාට ස්තුති කරන්න ඕන. මොකද පසුගිය මස ඇති වුණ නියඟය හේතුවෙන් කොතේගොඩෙකන්දට උග්‍ර ජල හිඟයක් පැවතුනත්, ඒ අවස්ථාවේ දී වතුර බවුසරය සභාවේ දී ඉල්ලීම් කළේ දිනකට කලින්. ඊට පසුදිනම වතුර බවුසරයක් ලබා දුන්නා. ඒ වගේම ඒ මාසෙම 13 වෙනිදා නැවත වතුර බවුසරයක් ලබා දීමට කටයුතු කළා. ඒ වෙනුවෙන්, ගමේ සියලු දෙනා වෙනුවෙන්, මම ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරන අතර, අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලට යොමු කරන්න තව ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමාලට ඌරල කියන්නේ කුඩා පාසලක් වුනත්, ඒකෙත් ඉන්නේ ඉගෙන ගන්න ළමයි. ළමයි දෙසීය පනහකට ආසන්න ළමයි පිරිසක් ඉන්නවා. නමුත් කිසිම පොලිස් ආරක්ෂාවක්වත් නැහැ. ගිය සතියේ බදාදා විතරක් හමුදා නිළධාරීන් දෙදෙනෙක් හිටියා. අද වෙනකොට පොලිස් නිලධාරියෙක්වත් හිටියේ නැහැ. ඒ ගැන ඔබතුමාට පුළුවන් ඔබතුමාලගේ දිස්ත්‍රික් නායකත්වය දැනුවත් කරලා, ඒ සඳහා කටයුතු කරන්න. මම මේ පිළිබඳ පොලිසියෙන් ඉල්ලීමක් කළා. නමුත් කිසිම නිලධාරියෙක් තවම නැහැ. ඔබතුමාලා ප්‍රදේශයේ ප්‍රධාන ඇමතිවරුන්ට හරි කියලා, මේ ගැන අවධානය යොමු කරන්න. මොකද සමහර පාසල් වල හමුදා නිලධාරීන් ඉන්නවා. මේ පාසලේ ළමා ජීවිත ගැනත් සැලකිලිමත් වෙන්න. ප්‍රජා පොලිස් ආරක්ෂක නිලධාරියෙක් විතරක් උදේ පාසල පටන් ගන්න වෙලාවට ඇවිල්ලා ආපහු යනවා. එතනින් එයාගේ රාජකාරිය අවසන්. මේ ගැන දැනුවත් කරල අවශ්‍ය කටයුතු කරන්න.

ඒ වගේමඅපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා අපේ සිංහල ජාතියේ ළමයි අඩු වෙන එක ගැන. මගේ මතකය හැටියට ළමයි තුන්දෙනෙක් ඉන්න රණවිරුවන්ට, තුන්වෙනි ලමයා ලැබුණු පසු එම දරුවගේ බැංකු පොතට රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දෙන වැඩ පිළිවෙළක් තිබුණා. නමුත් මේ රජය චක්‍රලේඛනයක් ගෙනැල්ලා ඒක අයින් කරලා තියෙනවා. ඒකෙන් තවත් අපේ ජාතිය අඩු වෙනවා. ඒ වගේම පසුගිය පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය සියලු දෙනාට අපේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, තුවාල වූ සියලු දෙනාටම ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා. ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුශංක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලූ දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න ගොඩක් කරුණු කතා කරන්න හිතාගෙන ආවත්, ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරු ඔක්කොම කරුණු කිව්වා. ඒ නිසා ඒ කරුණු කාරණා අත්හැරලා දැම්මා. තව කරුණු කාරණා ටිකක් තියෙනවා. සභාපතිතුමා කිව්වා ඒ ප්‍රකාශ නොකර ඉන්න කියලා. ඒක නිසා ඒ ටිකත් නැතුව, මම පාස්කු ඉරිදා මියගිය සියලු දෙනාට මගේ ශෝකය ප්‍රකාශ කරන අතර, තුවාල ලැබූ සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම තමයි සභාපතිතුමනි අපි සිංහල බෞද්ධ ජාතියත් වුණත් අපේ ආගමික නායකයන්ට වඩා ලොකු සේවාවක් මේ අවස්ථාවේ කාදිනල් හිමිපාණන් කරයි කියලා මට හිතෙනවා. නැත්නම් ඊට වඩා ලොකු ව්‍යසනයක් වෙන්න ඉඩ තිබුණා. එතුමාටත් මගේ ගෞරවය ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. බෞද්ධයෝ හැටියට අපේ මහා නායක හාමුදුරුවරු කිහිප පොලක් හිටියට, අපේ ජාතිය

වෙනුවෙනුත්, කිසි දෙයක් වෙනුවෙනුත් ලොකුවට සහභාගි වෙන්නේ නැහැ. ඒ මොකද කියලා දන්නේ නැහැ. නමුත් ඒ හැම වරප්‍රසාදයක්ම විඳින ගමන් අපේ බෞද්ධ දහම වෙනුවෙන්වත් කිසි දෙයක් කරන්නෙ නැති එක ගැන මම කියන්නේ. අපේ ආගමික නායකයෝ අනෙක් ආගමික නායකයෝ ආදර්ශයට අරගෙන හරි, ඉදිරියෙදි හොඳ රටක් නිර්මාණය කරන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

### ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

ගරු සභාපතිතුමා ඇතුළු අපේ මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමියගෙන්ද අවසරයි. ඇත්තටම මෙතනදී පසුගියදා සිදු වූ ප්‍රහාරයෙන් මියගිය අය ගැන කවුරුත් කණගාටුව ප්‍රකාශ කළා. මම ඒ ගැන කතා කරන්න යන්නේ නැහැ. ගිය සතියේ අපේ අණ්ඩුකාරතුමා මෙම ස්ථානයට පැමිණියා. අපි දේශපාලන වශයෙන් පාර්ලිමේන්තුවේ තිබෙන දේවල් ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් සහ පත්තර වැනි මාධ්‍යවලින් දැනගන්නවා. ඇත්තට අපේ මේ සභාවේ ආදායම වැඩි කරගන්න වැඩ පිළිවෙළක් සකසන්න කියලා එදා ආණ්ඩුකාරතුමා ප්‍රකාශ කළා. අපේ සභාවේ දී සිදුකරනු ලබන සියලුම යෝජනා සිදුකර ගැනීමට අපහසු තත්ත්වයක් තිබුනත්, කොයි විදිහට හරි ආදායම වැඩි කිරීමේ වැඩපිළිවෙලක් කරන්න කිව්වා. ඒ නිසා මම අපේ ගරු සභාපතිතුමාට කියනවා අපේ සභාවෙ කමිටු පත්කරලා තියෙනවා. ඒ කමිටු මාසෙකට දවසක් කැඳවලා, මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන, ඒ අදහස් ටික එකතු කරගෙන, යම්කිසි ඵලදායී වැඩපිළිවෙළක් කර ගැනීමට හැකියාව ලබා ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම වෙසක් පොහොය නිමිත්තෙන් ගම්වාසී, රටවාසී, මියගිය සියලු දෙනාට පින් පමුනුවා, අපේ යටලමත්ත විහාරස්ථානයේ අපි දොළොස් වැනි දා ඉඳලා පින්කම් කරනවා. රටට දැයට සාමය පැතිරේවා කියලා පින්කම් මාලාවක් පවත්වනවා. ඒ වගේම අපි ශීල ව්‍යාපාරයක් පවත්වනවා. අවුරුදු හැටක විතර ඉඳලා ශිල ව්‍යාපාරයේදී උදේ දානය ලබා දෙන්නේ අපේ නන්දන මන්ත්‍රීතුමාගේ නිවසින්. අපේ නන්දන මන්ත්‍රීතුමා ඉතා හොඳ දායක මහත්මයෙක්. අපේ විජිත් මහත්මයා බෙම්බඩ පන්සලේ පිංකම් මාලාවක් සිදු කරනවා. ඒ වගේම අපේ ගමේ මුස්ලිම් පවුල් 03 ක් තියෙනවා. ඒ අය නම් අහිංසක මිනිස්සු. අපි ඒ මුස්ලිම් පවුල් ගැන සෙවිල්ලෙන් ඉන්නෙ. අපේ යටලමත්තෙ අයට කවදාවත් කිසිදු කරදරයක් වෙන්නෙ නැහැ. නැවතත් කියන්නේ අපි ආදායම් මාර්ග වැඩි කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කළ යුතුයි කියලා යෝජනා කරමින්, ලැබුවා වූ නව වසර ඔබ සැමට සුභ වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

### ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව

ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, අද අපේ සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් බොහොමයක් ප්‍රකාශ කළේ පසුගිය පාස්කු ඉරිදා දින අපේ රටේ සිදුවුන ව්‍යසනකාරී තත්ත්වය පිළිබඳව. අපේ රටේ මෑත ඉතිහාසයේ සිදුවුණු භීෂනම දවස තමයි ඒ සිදුවීම සිදු වුණු දවස. එම සිදුවීම සිදු වුන දිනයේ මම අපේ ප්‍රියන්ති මන්ත්‍රීතුමිය සංවිධානය කරපු අවුරුදු උත්සවයකට සහභාගි වෙලා හිටියෙ. එවිට ප්‍රියන්තා මන්ත්‍රීතුමියගෙ පුතණුවන් තමයි කොළඹට බෝම්බ ගහලා කියලා පණිවිඩය කිව්වේ. නමුත් මුලින්ම මම විශ්වාස කළේ නැහැ. නමුත් ටිකක් වෙලා යනකොට IS ත්‍රස්තවාදී ක්‍රියාවක් ද කියලා මගේ හිතටත් දැනුනා. මොකද කොටි ත්‍රස්තවාදීන්ගෙන් බෝම්බයක් පිපිරෙන්නෙ නැති බව අපි දන්නවා. මොකද අපේ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ තිස් වසරක යුද්ධය සහමුලින්ම අවසන් කරළා. රට යථා තත්ත්වයට පත් කළා. අපේ මිනිස්සු බොහොම සාමකාමී දිවි පෙවෙතක් ගත කළා. පහුගිය අවුරුදු දවස්වල අපේ ආර්ථිකය බොහොම දුර්වල මට්ටමක තිබුණත්, අපි සල්ලි නැහැ කියල කෑ ගැහුවේ නැහැ. සතුටින් අවුරුදු සැමරුවා. පසුගිය 21 වනදා සිදුවුණු මිලේච්ඡ ප්‍රහාරය නිසා අපේ මනස සම්පූර්නයෙන්ම අවුල් වුණා. ඒ පිපිරීම තුළ මිය ගිය සියලුම

ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම විදේශීය ජනතාවටද නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට මුළු බල ප්‍රදේශයේම ශෝකය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඒ වගේම ඒ තුවාල ලැබූ සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට වර්තමාන රජයේ විදේශ ඇමතිතුමා කියනවා. මේ රට සිංහල බෞද්ධ රටක් නෙවෙයි කියලා. මම ඒ සම්බන්ධව සම්පූර්ණ විරෝධතාවය දක්වනවා. මොකද අති උතුම් කාදිනල් හිමිපාණන් මේ රට සිංහල බෞද්ධ රටක්, බෞද්ධයෝ තමයි මූලික කියලා කියද්දි අපේ විදේශ ඇමති මේක සිංහල බෞද්ධ රටක් නොවෙයි කියලා කියන එක, එකහෙලාම ප්‍රතික්ෂේප කරනවා. සිංහල බෞද්ධ රටක් විදියට සියලුම ජාති ආගම් කුල භේද නැතුව සියලු දෙනා ඒකරාශී වෙලා සහජීවනයෙන් කටයුතු කරන උතුම් රට මේක. අපි අපේ ප්‍රාදේශීය සභාව ගැන හිතුවොත්, පසුගිය කාල වකවානුව තුළ අපේ සභාවේ ලේකම් ධුරය දැරුවේ මුස්ලිම් ජාතික නිලධාරිනියක්. අපේ සහජීවනය එතනින්ම පෙනුනා. ඒ අනුව නැවතත් මම මුළු බල ප්‍රදේශය වෙනුවෙන්ම ඒ කතාවට විරෝධය දක්වනවා. ඒ ම්ලේච්ඡ ප්‍රහාරය නිසා අපි සියලුම මුස්ලිම් ජනතාවට ප්‍රහාර එල්ල කරන්න නරකයි. වර්තමානයේ ඇති වී ගෙන එන තත්වය අපි ඉක්මනින්ම සමනය කළ යුතුයි. එහෙම සමනය නොකලොත්, මේ රටේ පෙර සිදු වුන ව්‍යසනයට වඩා විශාල ව්‍යසනයක් ඉදිරි කාලෙදි ඇතිවෙන්න පුළුවන්. අපේ සිංහල රට ආරක්ෂා කරගන්න අපි එකමුතුව සහයෝගයෙන් කටයුතු කරන්න අවශ්‍ය බව දැනගන්න ඕන. ඊයේ පෙරේදා සිදුවුන සිදුවීම් ඉතා භයානකයි. බොහොම ව්‍යාකූලයි. ඒ වගේම අද පාසලට ළමයි යන්නේ නැහැ. ආරක්ෂාව පිළිබඳ විශ්වාසයක් නොමැති වීම නිසා. අපේ හිටපු ජනාධිපති ජේ ආර් ජයවර්ධන මැතිතුමා, තමන්ගේ ආරක්ෂාව තමන් බලාගන්න කියලා ප්‍රකාශයක් කරලා තිබුණා. හිටපු ආරක්ෂක ලේකම් ප්‍රකාශ කළා. හැම තැනටම ආරක්ෂාව දෙන්න බැඳිලා නැහැ කියලා. ඒකත් අපි ප්‍රතික්ෂේප කරනවා. රටක පාලකයෝ හැටියට සියලු දෙනාට ආරක්ෂාව ලබාදිය යුතුයි. ආරක්ෂක ලේකම් ඒ සම්බන්ධව වගකිව යුතුයි. හෝටල්වල ආරක්ෂාව දෙන්න ඒකෙ ආරක්ෂක නිලධාරීන් ඉන්නවා කිව්වා. එවැනි දුර්වල ලේකම්වරු තියාගෙන හිටපු රටක් තමයි මේක. අපි එක එක්කෙනාට බෝලේ පාස් කරන්න නරකයි. දේශපාලන වශයෙන් වාසි ගන්න නරකයි. අපි සාමකාමී රටක් විදියට ආරක්ෂක තත්වය බොහොම ඉහළින් තිබුණත්, ආරක්ෂක සේවා වල වැඩ කටයුතු බොහොම ඉහළින් සිදුවුන, බුද්ධි අංශ බොහොම වැදගත් විදියට කටයුතු කළා. ඇමරිකාවේ රුසියාව වගේ රටවලට වඩා වටිනා බුද්ධි අංශ ලංකාවේ ක්‍රියාත්මක වුණා. නමුත් යම් යම් හේතු සාධක මත එම අංශවලට දීපු නායකත්වය අඩපණ කරලා, සමහර බුද්ධි අංශ නායකයින් සිරගත කරවලා තියෙන තත්ත්වයක් මත තමයි මේ තත්ත්වය ඇතිවුණේ. ඒ වගේම මේ භීෂණයට කලින් කුඩු ව්‍යාපාරය තිබුණා. ඒ කුඩු ව්‍යාපාරයයි, කඩුයි අතර සම්බන්ධයක් ඇති බව අපට පේනවා. මේ අවස්ථාවේ බොහොම හිතලා මතලා වැඩකටයුතු කරන්න ඕන කාලවකවානුවක්. මොකද අද ඊයෙ ඉඳල කඩු එකතු කරගත්තෙ නැහැ. ඒ වගේම අද ඊයෙ ඉඳල කුඩු ව්‍යාපාරය ඇතිවුනෙත් නැහැ. මේක දීර්ඝකාලීන සැලසුමක් අනුව කෙරෙන වැඩක් කියලයි අපට තේරෙන්නේ. ආරක්ෂාව සඳහා බුද්ධි අංශ කටයුතු කරන විට ඒ බුද්ධි අංශ අඩපණ කර, ඔවුන්ගේ වටිනාකම අඩු කළොත්, අපේ රටට සිදුවන දේ අපි කනගාටුවෙන් වුණත් කියන්න ඕන. ඒ වගේම අපේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ සභාපති කෙනෙක් වන, වර්තමාන ගරු මන්ත්‍රී සහබන්දු මහත්මයා කිව්වා මේ දීගය හරි යන්නේ නැහැ කියලා. ඔය දීගෙට පොරොන්දම් හදපු කපුවො ටික තමයි කපෝති කරන්න ඕන. මේ කපුවන්ගේ යටි අරමුණු වෙනස්. ඒ නිසා ඒ කපුවො පිළිබඳව අපි හිතන්න ඕන. නමුත් දැන් මොනව කරත් අපට බේරෙන්න බැහැ. මම අපේ සභාවේ වුණත් සුහදව කතා කරන්න කියල කිව්වෙ, අපි බෙදීමෙන් ඉඳලා බැහැ. අපි මහ ඡන්දයකදී පක්ෂවලට බෙදිලා කෑගහමු. නමුත් වර්තමානයේ එහෙම බෙදී වෙන්වෙලා කතා කළොත් මම හිතන්නෙ හුඟක් දෙනාට එය ප්‍රයෝජනවත්, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හැමෝටම රටේ ඕන තැනක ජීවත් වෙන්න අවසර තියෙනවා. නමුත් අපේ සිංහලයන්ට විතරයි හැමතැනම ගිහිල්ලා කතා කරන්න බැරි වෙලා තියෙන්නේ. කොහොම නමුත් මේ අවස්ථාවේ අපි බොහොම කල්පනාකාරීව කටයුතු කළ යුතු අවස්ථාවක්. සිංහලයෝ නිවට

නැහැ. සිංහලයො ගෞරවනීය ජාතියක් හින්ද තමයි පසුගිය දවස්වල බුද්ධිමත්ව කටයුතු කලේ. නැත්නම් 1983 වගේ වුනානම්, අද අපේ රට එකම ලේ විලක්. අපේ පෙර වාසනාවට තමයි පාස්කු ඉරිදා දින මේ සිදුවීම සිදු වුනේ. මම හිතන්නේ විනාශ වෙච්ච ජීවිතවලට අපි ගෞරව කළ යුතුයි. මොකද ඒ ජීවිතවලින් වන්දි ගෙවලා අපි ආරක්ෂා කරල දුන්නා. එම සිද්ධිය තව මාස දෙක තුනකට පස්සේ සිදුවුණා නම්, අද අහුවෙන කඩු කිනිසි එක්ක බලන විට මොනවයින් මොනවා වෙයිද කියලා හිතාගන්න බැහැ. බුද්ධාගම අදහන නිසා අපේ රට හැමදෙයකින්ම බේරෙනවා. දෙවියෝ අපි දිහා බැලුවා. ඒ මිනිස්සු ස්වර්ගයට යන්න මිනී මරනවා. නමුත් අපි බලාපොරොත්තු වෙන්න ඕන නිවන් යන්න. රට අරාජික නොවී තියාගන්න එක අපි කාගේත් වගකීම වෙනවා. මම ඒ ගැන මීට වඩා කතා කරන්න යන්නේ නැහැ.

ඒ වගේම මම කියන්න ඕන. ගරු මන්ත්‍රීවරුන්ට සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න, සභාවට එනකොට තමන්ගෙ ඇඳුම පිළිබඳව සැලකිලිමත් වෙන්න. සියලු දෙනා කඩේ යනවා වගේ එන්න එපා. සභාවට සුදුසු නියමිත ඇඳුමක් ඇඳගෙන එන්න. ඒ වගේම මේ අවස්ථාවෙත් මන්ත්‍රීවරුන් එළියට වෙලා ඉන්නවා. සභාපති හැටියට දැඩි පාලනයක් ගෙන යන පුද්ගලයෙක් නොවන නිසා එහෙම කරන්න පුළුවන්. නමුත් එහෙම හිතන්න එපා. ඒ නිසා සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න. ඔබතුමන්ලගේ ගරුත්වය ආරක්ෂා කරගන්න කටයුතු කරයි කියලා, මම බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම පසුගිය දවසක ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා මෙම ස්ථානය නිරීක්ෂණය කරලා ගියා. මන්ත්‍රීවරු සියලු දෙනාට එන්න කියල දැනුවත් කළාට, මන්ත්‍රීවරු කිහිප දෙනකුට ඒ අවස්ථාවට සහභාගි වෙන්න හැකියාවක් තිබුණෙ නැහැ. එතුමා අපේ සභාවට පැමිණීම ගැන අපි එතුමට ගරු කරනවා.

ඒ වගේම ආදාහනාගාරෙයේ අවශ්‍යතාවය ගැන කතා කරද්දි, ඇල්පිටිය වතු සමාගමට අයත් වළකුඹුර ප්‍රදේශයේ ස්ථානයක් අපි නිරීක්ෂණය කලා. ඒක අපට ලබා දීමට දැන් කටයුතු කරමින් පවතිනවා. යථා කාලයේදී ඒ කටයුත්ත අපට කරගන්න පුලුවන් වෙයි කියලා හිතනවා. ඒ වගේම පතිනායක මන්ත්‍රීතුමා කිව්ව වගේ, අපට අලුත් වතුර බවුසරයක් ලැබුණා. නමුත්, අපට ඒක තවම නීත්‍යානුකූල තත්ත්වයෙන් ලැබුණේ නැහැ. වතුර ප්‍රශ්න ඇති වුණ වෙලාවෙදි ලීටර් 500 වතුර ටැංකි හතරක් ගාල්ල නගර සභාවෙන් ගෙන්න ගත්තා. ඊට පස්සේ තමයි පළාත් පාලන කොමසාරිස්තුමාට ලැබුණු බවුසරය අපට ලබා දීමට කටයුතු කළේ. මේ වෙනකොට අපි ඒ බවුසරයෙන් වතුර ලබාදීම් කරලා තියෙනවා. බොහෝ දුරට ඒ බවුසරය අපට ලබාගන්න පුළුවන් වෙයි කියලා හිතෙනවා. දැනට උඩුගම උප කාර්යාලයේ ගාල් කරලා තියෙනවා. ඒ වගේම ආදායම් තත්වය ගැනත් සැළකිලිමත් වෙලා අපි ඉදිරියේදී ජලය සැපයීම පිළිබඳ වැඩපිළිවෙළක් සිදු කරන්න ඕන. ඒ වගේම හදිසි අවශ්‍යතාවයට වතුර ටැංකි ලබාදීම පිළිබඳව ගාල්ල නගරාධිපතිතුමාට ස්තූති වන්ත වෙන්න ඕන.

ඊලඟට මම යෝජනා කළා තල්ගස්වල පොළ පිළිබඳ, ඒ වගේම මාපලගම වෙළඳ සංකීර්ණය පහුගිය දා මම නිරීක්ෂණය කරද්දී ඒකෙ අඩුපාඩු බොහොමයක් තියෙනවා. ඇත්තටම ආර්ථික තත්ත්වයෙන් අපොහොසත් නිසා ඒ පිළිබඳ සොයා බලන්න බැරි වුණා. නමුත් ඉදිරියේදී ඒ කටයුතු කරන්න හැකියාව ලැබෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මොකද ව්‍යාපාරික ප්‍රජාවත් සමග සම්බන්ධ වෙලා ඒ කටයුතු කරන්න, මම ඒ ව්‍යාපාරිකයින් කිහිප දෙනෙක් සමඟ කතා කළා. ඒ අයට කියලා බිත්ති වල තීන්ත ආලේප කර ගන්න නම් පුළුවන්. ඒ වගේම වෙළඳ සංකීර්ණය තෙමෙනවා. ගොඩක් අපවිත්‍ර වෙලා තියෙනවා. කොහොමහරි මුදල් සොයාගෙන සකස් කිරීම් කරන්න ඕන. ඊළඟට තල්ගස්වල පොළ භූමියට ඇතුල්වන ස්ථානයේ කඩේ මුදලාලි, එයාලගේ වියදමින් අපේ අධීක්ෂණය යටතේ සංවර්ධන කටයුතු කරන්න අවසර දෙන්න කියලා දැන් කාලයක ඉඳලා අපෙන් ඉල්ලීම් කරනවා. ඒ නිසා ඒ අය කැඳවලා කතා කරලා කටයුතු කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම

තමයි අනවසර ඉදිකිරීම් පිළිබඳව කතා කළා. ගරු ආණ්ඩුකාරතුමා කිව්වේ අනවසර ඉදිකිරීම් තියෙනවා නම් දැන් හදිසි නීතිය යටතේ ඕන වෙලාවක එම අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න හැකියාව තියෙයි කියලා. හැබැයි තියෙන අනවසර ඉදිකිරීම් සේරම ඉවත් කරන්න වෙනවා. විශේෂයෙන් තල්ගස්වල ඉඳලා අලුත්වත්ත දක්වා තියෙන සමහර අනවසර ඉදිකිරීම් වලට r.d.a. එකෙන් නඩු දාලා තියෙනවා. ඒවා ඉවත් කරන්න යද්දි, යම් යම් ගැටලුකාරී තත්ත්වයන්ට පත්වෙනවා. කොහොම නමුත් ඉදිරියේදී ඒ අනවසර ඉදිකිරීම් ඉවත් කිරිමට අපි කටයුතු කරනවා. ඒ වගේම ගරු ආණ්ඩුකාරතුමා පැමිණි දවස පිළිබඳ සිදුවීමක් මව්බිම පත්තරේ පළවුණා. අළු යට ගිනි වැඩසටහන යටතේ. බද්දේගම සංචාරය කරලා එද්දී බද්දේගම ආයතනයකින් ලක්ෂ 37ක් ඇස්තමේන්තු කරලා තිබුනත්, ලක්ෂ දෙකකින් ආණ්ඩුකාරතුමා එම කාර්යය කළා කියලා පළවෙලා තියෙනවා. ඒ අතරතුර නාගොඩ ප්‍රාදේශීය සභාවට පැමිණි බවත්, එවැනි ඇස්තමේනතුවක් අපේ සභාවෙනුත් ඉදිරිපත් කළා කියලා තියෙනවා. ඒ වගේ දෙයක් අපි කරලා නැහැ. මම ඒ වෙලාවෙ කතා කරලා කිව්වා එය වැරදීමක්. එය නිවැරදි කරන්න කියලා. එය නිවැරදි කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කරපු යෝජනාව සහ ඉල්ලීම සම්බන්ධව අපි සලකා බලමු. මොකද ඔබතුමාගේ නමින් දාපු නඩුවක් නිසා නීතිඥ උපදෙස් මත කටයුතු කරමු. එකපාරටම ඒකට උත්තරයක් දී ගන්න අපහසු වේවි. කලින් ගෙවීම් කරලා පසුව නොගෙවා හැරිය හේතුව මොකක්ද කියල හොයල සාධාරණයක් ඉටු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද මේ සභාව වෙනුවෙන් ඉදිරිපත් වෙලා කටයුතු කිරීමේදී සිදුවුන අපහසුතාවය අනුව තමයි එවැනි දෙයක් වෙලා තියෙන්නෙ. අපේ වෙරංග මන්ත්‍රීතුමාට සිද්ධ වුනෙත් ඒ වගේ දෙයක්. පෞද්ගලිකව දැන් නඩුවට පෙනී සිටිනවා. මේ හැමදේම අපි සොයා නොබලා කරන වැඩ වල අතුරු ප්‍රතිඵල.

ඊළඟට ගම්පෙරළිය වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපෙන් අනුමැතිය ඉල්ලනවා. නමුත් වෙන සභාවල සභාවේ අධීක්ෂනය යටතේ තමයි වැඩ කටයුතු කරන්නේ. සමහර පාරවල් වල වැඩ අවසන් කරලා අපෙන් අනුමැතිය ඉල්ලන්නේ. ඒ වගේම ටී.ජී. සුමනසිරි මහත්තයා ගබඩාවක් හැටියට පාවිච්චි කරන්න, රෝහල ළඟ තියෙන අපේ ගොඩනැගිල්ල ඉල්ලලා තියෙනවා. එතුමා මීට කලිනුත් අපෙන් මේ ගොඩනැගිල්ල ඉල්ලීම් කලා. ප්‍රයෝජනයක් ගන්නේ නැති නිසාත්, අපට ආදායමක් ලැබෙන නිසාත් මේ ගොඩනැගිල්ල දුන්නට කමක් නැහැ. අපේ හිටපු සභාපති තුමා මේ ගොඩනැගිල්ලට රුපියල් එක්ලක්ෂ අසූ දාස් ගානක් වියදම් කරලා තියෙනවා. මෙහි ආයුර්වේදයකුත් දැම්මා, පෙර පාසලකුත් පවත්වාගෙන ගියා. නීත්‍යානුකූල අයිතිය නැති වුණාට පාවිච්චි කරන්නෙ අපි. ඒ නිසා අපි මේ ගොඩනැගිල්ල සාකච්ඡා කරලා ලබාදීමට කටයුතු කරමු. ඒ වගේම මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් සිසිල් අරුණසිරි මහත්මයාගේ පෙත්සමක් එක්ක ලිපියක් එවලා තියෙනවා. මීට කලිනුත් මේ මහතා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට යවපු ලිපිය අපට එවලා තිබුණා. අපට මේ ස්ථානය සොයා ගන්න නොහැකිව තමයි හිටියෙ. ඒ ලිපියෙ තිබුන දුරකථන අංකයට කතා කරලා තැන සොයා ගත්තා. අජිත් මහත්තයාගේ ගේ ඉස්සරහ ඉඩම. අපි මේක සභාවෙන් සංවර්ධනය කළේ නැහැ. අපෙන් අහල තියෙන්නෙ අපි සංවර්ධනය කලාද කියලා. නමුත් එහෙම කරේ නැහැ. ඊළඟට අජිත් මහත්තයා මූලික වෙලා ඇස්තමේන්තුවක් කරලා, පහුගිය සභාවක පිට්ටනි දෙකට මුදල් ඇවිල්ලා තිබුණා. අයිතිය තහවරු කරන්න ආවා. නමුත් අයිතිය නැති නිසා එය අවලංගු වුණා. අජිත් මහත්මයා නැවත කොළඹ ගිහිල්ලා කතා කරලා, මැනුම් නියෝග ගෙනැල්ලා, ඒ කටයුතු කළා. අජිත් මහත්තයම මැනුම් කරලා අපිට ගෙවන්න කියලා බිලකුත් ආවා. අපි මේක ගොඩ කිරීම් කරලා නැහැ. අපට නතර කරන්න කිව්වට අපි සභාව මැදිහත් වෙලා පුරවලා නැහැ. දැන් අපි එහි අයිතිය ලබා ගන්න, තාක්ෂණ නිලධාරි මහත්තයා ලවා සොයා බැලුවා. මේ ලිපිය ආවෙ මැයි 13 වැනිදා. ඊට කලින් අපි මනින්න ගිහිල්ලා ප්‍රශ්නයක් ඇති වුණා. ඒ නිසා තමයි අපි ස්ථානය අඳුන ගත්තේ. නමුත් මේ පෙත්සම යවපු කෙනා සම්බන්ධ කරගන්න බැරි වුණා. මේ ලියුම

ඉදිරි කටයුතු සඳහා යොමු කරමු. මේ වන විට මෙම ඉඩමේ අයිතිය සභාව සතු කිරීම සඳහා මැණුම් කටයුතු සිදු කර අවසන් වෙලා තියෙන්නෙ රු. පනස් හය දහස් ගණනක් ගෙවන්නත් තියෙනවා. මේ සම්බන්ධව තොරතුරු දන්නේ ඒ ප්‍රදේශය නියෝජනය කරන ගරු මන්ත්‍රී අජිත් මහතා සහ ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි මහතා ඒ නිසා මේ සම්බන්ධව සොයා බලන්න.

ඊළඟට වාහන වෙන්දේසියට ඉදිරිපත් වූ එම ඉල්ලුම්කරුවන් මුදල් නැවත ගන්න ආවම ප්‍රශ්නයක් වුණා. වාහන තුනටම මුදල් අය කරල තියෙන්නෙ එක ලදුපතකින්. ඒ නිසා මේ මුදල් බැඳපු අය නැවත දුරකථනයෙන් දැනුවත් කරලා ඉදිරියේදී j.c.b. යන්ත්‍රය හැර ට්‍රැක්ටර් ට්‍රේලරය හා බවුසරය වෙන්දේසි කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, 2019 වර්ෂයට අදාළව වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කරන්න ඕන. ඊළඟට මේ ඩෙංගු වැඩසටහන් කරන්න කියලා පළාත් පාලන කොමසාරිස්තුමා දැණුම් දීලා තියෙනවා. මේ ලිපිය එවන විට අපි ඩෙංගු වැඩසටහන් කරලත් ඉවරයි. වෛද්‍යවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ අපි සම්බන්ධ වෙලා ග්‍රාම නිලධාරී වසම් 6 ක වැඩසටහන් කළා. අනිත් ග්‍රාම සේවා වසම් වලත් ඉදිරියේදි මෙම වැඩසටහන කරනවා. නමුත් මේවන විට අපේ බල ප්‍රදේශයේ ඩෙංගු අවධානම් තුලින් තොර කලාපයක්බවට පත් වී ගෙන යන බැව් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා දැණුම් දීලා කියෙනවා. ඩෙංගු වැළඳුන අය 17දෙනෙක් සිටින බව වාර්තා වෙලා තියෙනවා. නමුත් මෙම ඩෙංගු වැලදුන් අය පිට ප්‍රදේශවලින් ආසාධනයටලක් වෙලා මෙහේට ආව අය. නමුත් අපි අපේ බල ප්‍රෙද්ශය තුල මෙම වැඩසටහන් නිරතුරුව සිදු කිරීමට කටයුතු කරනවා. ඒ වගේම ලෝක ළමා දිනය සහ වැඩිහිටි දිනය ඉහළින් සැමරීමට මගේ බලාපොරොත්තුවක් තියෙනවා. අපේ බල ප්‍රදේශයේ සියළුම පෙර පාසල් දරුවන් එක තැනකට කැඳවලා එම සම්පූර්ණ දිනයම දරුවන් වෙනුවෙන් සතුටු විය හැකි විනෝදජනක ක්‍රීඩා සමඟ වැඩිහිටියවන් වෙනුවෙනුත් වැඩසටහන් කිරීමට බලාපොරොත්තු වන අතර ඒ වෙනුවෙන් සභා අරමුදලින් රුපියල් 150000.00ක මුදලක් වෙන් කිරීමට යෝජනා වුවත් මම උත්සාහ ගන්නවා ප්‍රදේශයේ දානපතියන් සහ පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගෙන මෙම වියදම් සොයා ගැනීමට.

ඒ වගේම යෝජනා වාරෙදි නෙලී මන්ත්‍රීතුමිය කිව්වා. ආදායම් තත්වය උත්පාදනය කිරීමට වැඩ කටයුතු කරන්න කියලා. අපේ උප සභාපතිතුමා වරිපනම් ගාස්තු පිළිබඳව වැඩ කටයුතු කරමින් පවතිනවා. ඉදිරියේ දී ඒ කටයුතු සාර්ථකව ඉටු කර ගන්න පුළුවන් වේවි. ඊළඟට අපේ විජිත් සහබන්දු මහත්මයාගේ බල ප්‍රදේශය බීඩී5 ඇල්ල සංවර්ධනය කිරීමේ කටයුත්තේ දී මම ඒ ගැන ආණ්ඩුකාරතුමාට කිව්වා. ඒ සම්බන්ධව යෝජනාවක් එවන්න කියලා කිව්වා. අපේ මලාමුර ඇල්ලත් සංවර්ධනය කරලා නාන තටාකයක් ඉදිකරන්න වෙනත් ආයතනයකින් උදව් කරන්නම් කිව්වා. බීඩී5 ඇල්ලට යන මාර්ගයේ ඉඩම් අයිතිකරුවන් පාර ලබාදෙන්න කැමතියි. එතැන දැන් මත්පැන් පාවිච්චියත් සිදුවෙනවලු. ඒ වගේම අවුරුද්දෙන් පස්සේ පවත්වන සභාවාරය වන විට අපි හුඟක් බල ප්‍රදේශ වල දැන් ගොඩක් කටයුතු කෙරීගෙන යනවා. විදුලිය ගැන කතාකරනවනම්, කොයි කවුරු කිව්වත් සෑහීමකට පත්වෙන්න බැහැ කියලා, අපි විදුලිය හදාගෙන යනවා. වැඩිපුරම විදුලිය හදපු තැන් වල තමයි නැවත යන්න සිද්ධවෙලා තියෙන්නේ. ඒ වගේම මිනිස්සු කියනවා විදුලිය හදන්න ගොඩක් දවසකින් ආවෙ නැහැ කියලා. ඒ වගේම මේ අවස්ථාවේදී විදුලි කාර්මික මහත්මයා අනතුරකට ලක් වෙලා ඉන්නේ. වෙනත් අයෙක් යොදවල තමයි මේ වන විට විදුලිය හදාගෙන යන්නේ. මම හිතන්නේ විදුලිය පිළිබඳ 75%ක් විතර ඉවරයි කියලා මට හිතෙනවා. ඉදිරියටත් ඒ කටයුතු යහපත් විදියට සිදු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම පසුගියදා අපේ බල ප්‍රදේශයේ හාමුදුරුවන් වහන්සේ දෙනමක් අපවත් වුණා. එක් හාමුදුරු නමක් අපවත් වුණා. අනිත් හාමුදුරු නම අපවත් කෙරෙව්වා. ඒ වගේම මේ දුරකථනයට පුළුවන් රටක් ගිනි තියන්න. මේ සිදුවීම සිදුවුන දවසේ මම ගාල්ලේ ඉන්න වෙලාවේ නුවරින් කතා කරල කෙනෙක් අහනවා, ඔබතුමා නේද නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඔබතුමාලගේ ප්‍රදේශයේ IS කාරයෝ

හාමුදුරුවෝ නමක් අපවත් කරල නේද කියලා. එම මහතාට දුරකථනයට SMS පණිවිඩයක් ලැබිලා තියෙනවා කිව්වා. අන්න එහෙම තමයි මේ විස්තර යන්නේ. ඇත්තටම ඒ අපවත් වුන හාමුදුරුවන් වහන්සේ සිල්වත් ගුණවත් හොඳ හාමුදුරුනමක්. ඒ කටයුතු වලදී අපේ සභාව මූලික වෙලා, අපේ පියල් මන්ත්‍රීතුමා, ධර්මසිරි මන්ත්‍රීතුමා, වනමල් මන්ත්‍රීතුමා, බන්දුල මන්ත්‍රීතුමා මූලික වෙලා එකට එකතුවෙලා, සහය දක්වලා අපේ අය කියන හැඟීමෙන් යුතුව, බේදයක් නැතුව ඒ කර්තව්‍ය සිදු කළා. ඒ වගේම උඩවැලිවිටිතලාව පන්සලේ හාමුදුරුවන් වහන්සේ අපවත් වෙච්ච වෙලාවේ අපට කරන්න පුළුවන් උපරිම උදව් කළා. අපි අපේකම පෙන්නුවා.

ඒ වගේම අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා අද JCB යන්ත්‍රය පිළිබඳ කතා කළා. මොකද JCB යන්ත්‍රයට, අනෙක් ට්‍රේලරයට සහ බවුසර් ට්‍රේලරයට එකම ලදුපතකින් මුදල් ගනිපු නිසා ප්‍රශ්නයක් සිදුවුණේ. කොමසාරිස්තුමාට ඒ පිළිබඳ දන්වලා නැවත ඒ මුදල් ලබාදීමට අපි කටයුතු කරනවා. ඉදිරියේදී ටෙන්ඩර්කරුවන් දුරකථනයෙන් හෝ සම්බන්ධ කරගෙන ඒ සඳහා පිළිතුරක් දෙන්නම්. ඒ වගේම නන්දන මන්ත්‍රීතුමා සහ තරංග මන්ත්‍රීතුමා අපේ බල ප්‍රදේශයට ළමා උද්‍යාන ලබා දීමට කටයුතු කරන්න හැකියාව ඇති බවත්, ඒ සඳහා ස්ථානයක් ලබා දෙන්න කියලා ඉල්ලීම් කළා. මාපලගම මහජන ක්‍රීඩාංගනය සහ උඩුගම අපේ පෙර පාසල තියෙන ස්ථානයෙත් මෙම ළමා උද්‍යාන ඉදි කරන්න පුළුවන් කියලා මම ප්‍රකාශ කරනවා. වජිර ඇමතිතුමාගේ අනුග්‍රහය යටතේ ළමා උද්‍යාන දෙන එක අපි සතුටින් බාරගන්නවා. ඒ කටයුත්ත හැකි ඉක්මනින් කරගන්න ඔබතුමාලගේ සහය ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඊට වඩා යමක් කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එහෙමනම් අද භීෂණ කාලේ රටේ ව්‍යාකූල තත්ත්වයක් තිබුනත්, තමන්ගෙ මේ බල ප්‍රදේශයට විය යුතු ඒ සේවය ඉටු කරන්නට ඒ පිළිබඳ නොතකා අද දින සභාවට පැමිණි උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ එක්කම අපේ බෞද්ධයාට තියෙන පළමු වටිනාම අවස්ථාව වන වෙසක් උත්සවය අපේ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සහ ප්‍රාදේශීය සභාවට අදාළ ස්ථානවල ඉතා උසස් අයුරින් සැරසිලි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් මම ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා. තමන්ගේ බල ප්‍රදේශවල වෙනදාටත් වඩා වෙසක් සැරසිලි සිදුකරලා, අපේ බෞද්ධකම ඔප් නංවන්න කටයුතු කරන්න කියලා. එහෙම නම් සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සැමට සම්මා සම්බුදු සරණයි. බොහොම ස්තුතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:- ..............................